# 2015

# කාර්ය සාධන වාර්තාව
# PERFORMANCE REPORT
# செயலாற்றுகை அறிக்கை



ශ්‍රී ලංකා දේශීය ආදායම්
இலங்கை உள்நாட்டு இறைவரி
SRI LANKA INLAND REVENUE

# දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ

# කාර්ය සාධන වාර්තාව

# 2015

**කලයාණී දහනායක**

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

## 2015 වසර තුළ කාර්ය සාධන සාරාංශය

2015 වසර තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද සමස්ත ආදායම රුපියල් මිලියන 560,422 ක් වූ අතර, එය කලින් වසරට වඩා සියයට 9 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. එමගින් රජයේ සමස්ත ආදායමට සියයට 38.52 ක දායකත්වයක් ලබාදුන් අතර, වසර තුළ දළ දේශීය නිෂ්පාදනයට දායකත්වය සියයට 5.01 ක් විය.

බදු අනුකූලතාවය ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසීමේ සහ සවිබලගැන්වීමේ ක්‍රියාමාර්ග යන්නෙන් සමන්විත ඒකාබද්ධ යාන්ත්‍රණයෙහි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිරත විය.

බදු ගෙවන්නන් විසින් රජයේ ආදායමට දක්වන ලද මා හැඟි දායකත්වය හඳුනාගනිමින් ඔවුනට වරප්‍රසාද කාඩ්පත් නිකුත් කිරීමේ පැසසුම් ක්‍රියාවලිය වර්ෂය තුළ දී තවදුරටත් අඛණ්ඩව ක්‍රියාවට නංවන ලදි.

අනෙක් අතට, බදු විගණන, හෙළිදරව් නොවූ ආදායම සහ පිරිවැටුම විධිමත් කිරීම මගින් වසර තුළ දී රුපියල් මිලියන 225,424 ක මුදලක් බදු වශයෙන් අයකර ගැනීමට හැකි විය. ඒ මත පදනම්ව වසර තුළ දී අය කරන ලද අතිරේක බදු වටිනාකම රු. මිලියන 17,023 ක් විය.

පැහැර හරින ලද බදු අයකර ගැනීමේ පනතට අතිරේක වශයෙන්, බදු අයකර ගැනීම සඳහා අදාළ ප්‍රඥප්තීන් හි දක්වා ඇති පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග සහ පියවර අඛණ්ඩව ගෙන ඇත.

ව්‍යවස්ථාවන් හි ඇතැම් විධිවිධාන සම්බන්ධයෙන් අවශ්‍ය මගපෙන්වීම් සහ උපදෙස් ලබාදීමට අතිරේක වශයෙන්, බදු නීති අර්ථනිරූපණය සඳහා වන කමිටුව විසින් වසර තුළ දී සිද්ධීන් 38 කට අදාළව අර්ථනිරූපණ ලබාදෙන ලදි.

තොරතුරු අංශය, බදු සේවා අංශය, සෙසු අංශ සහ ප්‍රාදේශීය කාර්යාල මගින් ලබාදෙන ලද මූලික ක්‍රියාමාර්ග සමඟ සැලකිය යුතු අලුත් බදු ලිපිගොනු සංඛ්‍යාවක් විවෘත කර ඇත.

වර්ෂය තුළ දී උපකාර හා තොරතුරු අපේක්ෂා කරන සෑම තැනැත්තෙකුටම සහාය දැක්වීම සඳහා බදු සේවා අංශය අවශ්‍ය නිලධාරීන්ගෙන් සමන්විතව ශක්තිමත් කරන ලදි. බදු ගෙවන්නන් මෙන්ම දේ.ආ. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය දැනුවත් කරවීමේ අභිලාෂය පෙරදැරිව සම්මන්ත්‍රණ සහ දේශන කිහිපයක් සංවිධානය කරන ලදි.

ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ව්‍යාපෘතිය යටතේ 2015 වසරේ දී, තක්සේරු (සංස්ථාපිත ආදායම් බදු), එකතු කළ අගය මත බදු, රඳවා ගැනීමේ බදු සහ බදු ගෙවන්නන්ගේ මූලාමය සඳහා අවශ්‍යතා අවසන් කරන ලදි. දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය භාෂාත්‍රයෙන්ම 2015 මැයි මස 30 වන දින ප්‍රසිද්ධ කරන ලද අතර එය 2015 ජුනි මස 3 වන දින නිල වශයෙන් දියත් කරන ලදි. NCSI-S මගින් සංවර්ධන සහ පද්ධති ඒකාබද්ධ කිරීමේ පරීක්ෂණ (SIT) අවසන් කරන ලදුව, භාවිත කරන්නන් පිළිගන්නා පරීක්ෂණය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් 2015 අගෝස්තු මස ආරම්භ කරන ලදි. 2 වන අදියර සඳහා අවශ්‍යතා රැස්කිරීම BPR 2015 ඔක්තෝබර් මස ආරම්භ කරන ලදි.

.

## දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව බදු ගෙවන ජනතාව උදෙසා මා හැඟි සේවයක් ඉටු කරන්නා වූ, බදු ගෙවන්නා කෙරෙහි හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත් වීම.

## මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මගින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මගින් අදාළ බදු නීති හා අනෙකුත් අණපනත්වලට යටත්ව බදු අය කිරීම

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, කඩිනම්ව, හා ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම

## ක්‍රමෝපායික ඉලක්ක

ස්වේච්ඡාවෙන් බදු ගෙවීම කෙරෙහි අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දිරි ගන්වන අතරම, ඊට අනුබල සැලසෙන වැඩ සටහන් ඔස්සේ බදු නීති රීති කෙරෙහි ඔවුන්ගේ ස්වේච්ඡා අනුකූලතාවය වැඩි දියුණු කිරීම හා එසේ අනුකූලතාවය නොදක්වන්නන් සොයා දැන අදාළ අවස්ථාවන්හි දී ඔවුනට එරෙහිව සුදුසු කටයුතු කිරීම.

වැඩ කිරීමේ කාර්යක්ෂම ක්‍රම හා තාක්ෂණය යොදා ගැනීම මගින් සහ දැනට තිබෙන සම්පත් වඩා හොඳින් උපයෝගී කර ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත්කරගැනීම පෙරදැරිකරගෙන වඩාත් ඵලදායී අයුරින් දායකවීමට හැකිවනු පිණිස කළමනාකරණ හා තාක්ෂණික පුහුණුව මෙන්ම සේවා පළපුරුද්ද තුළින් කාර්යමණ්ඩලයේ ඵලදායීතාවය සහ වෘත්තීයමය බව ඉහළ නැංවීම.

## ප්‍රධාන නිලධාරීන්

| | |
|---|---|
| **කේ. දහනායක මහත්මිය** | **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්** |

### නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන්

| | |
|---|---|
| **කේ.ඒ.ජී. අභයරත්න මහතා** | විමර්ශන, ප්‍රාදේශීය කාර්යාල සහ තොරතුරු |
| **ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා** | මානව සම්පත් සහ මානව සම්පත් සංවර්ධන |
| **ඒ.එන්. ගුරුගේ මහතා** | විශාල බදු ගෙවන්නන්ගේ අංශය, සංස්ථාපිත බදු I සහ II, ඔට්ටු සහ සූදු බදු |
| **පී. රෝහිණී මහත්මිය** | ප්‍රසම්පාදන සහ සැපයුම්, 1 සහ 2 අංශය සහ උපයන විට ගෙවීමේ අංශය |
| **ආර්.එම්.පී.එස්.කේ. රාජපක්ෂ මහත්මිය** | බදු රැස්කිරීම සහ නිෂ්කාශනය, පැහැර හරින ලද බදු අයකර ගැනීම සහ නීති. |
| **ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා** | වක්‍ර බදු පරිපාලනය සහ නව සංස්ථාපිත බදු අංශ |
| **ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මෙනෙවිය** | බදු ප්‍රතිපත්ති, ක්‍රම සම්පාදන සහ සංවර්ධනය, ව්‍යවස්ථා සම්පාදනය, නියමයන් සහ ජාත්‍යන්තර කටයුතු, ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්. |
| **ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා** | තොරතුරු සන්නිවේදන තාක්ෂණය. |

## ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන්

| | |
|---|---|
| **එම්.ජී. සෝමචන්ද්‍ර මහතා** | මානව සම්පත් සංවර්ධනය |
| **සී.එච්. වීරසිංහ මහත්මිය** | සංස්ථාපිත බදු II |
| **එච්.එම්.ඩී. මුණසිංහ මහත්මිය** | විශාල බදු ගෙවන්නන්ගේ අංශය (LTU) [6C අංශය, 10 අංශය, වි.බ.ගෙ. විශේස විගණන] |
| **එස්. කරුණාරත්න මහත්මිය** | ලේකම් අංශය |
| **ඕ.පී.පී.කේ. සිරිසේන මහතා** | ප්‍රසම්පාදන සහ සැපයුම් |
| **කේ. ධර්මසේන මහතා** | විමර්ශන |
| **බී.ඒ.ඩී.ඩී. හේරත් මහත්මිය** | මිල පැවරුම් නියෝග සහ පර්යේෂණ |
| **ඩී.බී. දිසානායක මහතා** | ජා.ගො.බ., ආ.සේ.ගා., ඔට්ටු සහ සූදු බදු, ආ.සේ.ගා., ර.බ. (පොළිය මත) කලාප II |
| **ඩී.ඩී.එන්.ජී. කෝරලේ ආරච්චි මහතා** | මානව සම්පත් |
| **ඩබ්.එස්.කේ. ද කොස්තා මහතා** | එ.අ.බ. (VAT) සහ ස.එ.අ.බ.(SVAT) |
| **එම්.එස්.එම්. ෆුවාඩ් මහතා** | සංස්ථාපිත බදු III |
| **පී.එල්.එස්. ලියනගේ මහතා** | නීති, තක්සේරු පාලන සහ මුද්දර ගාස්තු |
| **ඒ.ඒ. දයාරත්න මහතා** | කලාප III, උ.වි.ගෙ. අංශය සහ 1, 2 සහ 3 අංශ. |
| **ජේ. රත්නායක මහතා** | කලාප I |
| **ඊ.එස්. ද සොයිසා මහතා** | බදු සේවා අංශය |
| **එච්.එමම්.ඩබ්.සී. බණ්ඩාර මහතා** | තොරතුරු, සංනිවේදන, තාක්ෂණ සහ අභියාචනා |
| **ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා** | ජාත්‍යන්තර කටයුතු, |
| **ඩබ්.එම්.පී.එන්.බී. වනිගසේකර මහතා** | විශාල බදු ගෙවන්නන්ගේ අංශය I |
| **එම්.ජේ. ගුණසිරි මහතා** | එ.අ. බදු ආපසු ගෙවීම් සහ එ.අ.බ. විශේෂ විගණන |
| **ඩී. රණසිංහ මහතා** | තොරතුරු |
| **ආර්.එම්. ජයසිංහ මහතා** | සංස්ථාපිත බදු I |

**වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු**

වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද අණ පනත් අනුව පනවන ලද බදු පහත දැක්වේ:

| බද්ද | අදාළ අණ පනත් |
|---|---|
| ආදායම් බදු | 2007අංක 10, 2008 අංක 9 ,2009 අංක 19 2011 අංක 22, 2012 අංක 8, 2013 අංක 18, 2014 අංක 8 සහ 2015 අංක 9 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත |
| එකතු කළ අගය මත බදු, (මූල්‍යමය සේවා මත වූ එකතු කළ අගය මත බදු, එකතු කළ අගය මත වූ අත්තිකාරම් බදු විකල්ප එකතු කළ අගය මත බදු ඇතුළත්ව) | 2003 අංක 07, 2004 අංක 13, 2005 අංක 06, 2006 අංක 08 සහ 49, 2007 අංක 14, 2008 අංක 15, 2009 අංක 15, 2011 අංක 09, 2012 අංක 7, 2013 අංක 17, 2014 අංක 7 සහ 2015 අංක 11 දරන පනත් මගින් සංශෝධිත පරිදි 2002 අංක 14 දරන එකතු අගය මත බදු පනත |
| ආර්ථික සේවා ගාස්තු | 2007අංක 15, 2008 අංක 11, 2009 අංක 16, 2011 අංක 11, 2012 අංක 11, 2013 අංක 6, 2014 අංක 9 සහ 2015 අංක 13 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009 අංක 32, 2011 අංක 10, 2012 අංක 9, 2013 අංක 11, 2014 අංක 10 දරන සහ 2015 අංක 12 පනත් මගින් සංශෝධිත 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත |
| ඔට්ටු හා සූදු බදු | 2015 අංක 14 පනත මගින් සංශෝධිත 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනත |
| මුද්දර ගාස්තු | 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සහ 2008 අංක 10 සහ 2011 අංක 13 දරන පනත් මගින් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත |
| කොටස් ගණුදෙනු බද්ද | 2005අංක 05 දරන මුදල් පනත සහ 2007 අංක 13 දරන මුදල් පනත |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | |
| සමාජ වගකීම් බද්ද | 2005 අංක 5 දරන මුදල් පනත, 2006 අංක 11 දරන මුදල් පනත සහ 2008 අංක 08 දරන මුදල් පනත |
| ඉඩම් පැවරීම මත බද්ද | 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත |

කලින් පනවනු ලැබ දැනට අවලංගු කර ඇති පහත සඳහන් බදු සම්බන්ධයෙන් තක්සේරු සහ අය කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

| බද්ද | අදාළ ප්‍රඥප්තිය |
|---|---|
| ජාතික ආරක්ෂක බද්ද | 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බද්ද, සංශෝධිත පරිදි |
| භාණ්ඩ හා සේවා බද්ද | 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත, සංශෝධිත පරිදි |
| ජාතිය රැක ගැනීමේ දායක බද්ද | 1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක බද්ද, සංශෝධිත පරිදි |
| ධන බද්ද මත අධිභාරය | 1982 අංක 25 දරන ධන බද්ද අධිභාර පනත සහ 1989 අංක 8 දරන පනත |
| ආදායම් බදු මත අධිභාරය | 1984 අංක 12 දරන පනත සහ 1989 අංක 7 දරන පනත මඟින් සංශෝධිත 1982 අංක 26 දරන අදායම් බදු මත අධිභාර පනත |
| හර බද්ද | 2003 අංක 05, 2008 අංක 12, 2009 අංක 17 සහ 2011 අංක 14 යන පනත් මගින් සංශෝධිත 2002 අංක 16 දරන හර බදු පනත |
| බූදල් බද්ද | සංශෝධිත පරිදි 1980 අංක 13 දරන බූදල් බදු පනත |
| පිරිවැටුම් බද්ද (උතුරු පළාත) | 1981 අංක 69 දරන පිරිවැටුම් බද්ද, සංශෝධිත පරිදි |

පටුන


**2015 වසර තුළ කාර් ය සාධන සාරාංශය** III

**වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු** IX

**පටුන** XI

**I කොටස** 1

**මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය** 1

පරිච්ඡේදය 1 මානව සම්පත් 3
1.1 අනුමත කාර්ය මණ්ඩලය සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව 5
1.2 උසස් කිරීම් 6
1.3 විශ්‍රාම ගැනීම් 6
1.4 පුහුණු කිරීම 7

**II කොටස** 11

පරිච්ඡේදය 2 ආදායම් රැස්කිරීම 13
2.1 බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව 15
2.2 මුළු ආදායම් රැස්කිරීම 16
2.3 මුළු ආදායම් ප්‍රවාහය 17
2.4 ආදායම පෙර වසර සමඟ සැසඳීම 17
2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම 18
2.6 ආදායම් රැස්කිරීම් - ස්ව තක්සේරු පදනම සහ අනෙකුත් පදනම් 18
2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය 19
2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය 20
2.9 ආදායම් බදු රැස්කිරීම 20
2.10 එකතු කළ අගය මත බදු රැස්කිරීම. 23
2.11 ජාතිය ගොඩනැගීමේ බදු (NBT) රැස්කිරීම් 26
2.12 ආර්ථික සේවා ගාස්තු (ESC) රැස්කිරීම 28
2.13 උපයන විට ගෙවීමේ බදු (PAYE) රැස්කිරීම 28
2.14 රඳවා ගැනීමේ බදු (WHT) (පොළිය සහ නිශ්චිත ගාස්තු මත) 28
2.15 ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම 29
2.16 ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු රැස්කිරීම 29
2.17 මුද්දර බදු රැස්කිරීම 29
2.18 ඉඩම් පැවරීම මත බදු 29
2.19 දේශීය ආදායම් රැස්කිරීම 2011 සිට 2015 දක්වා (බදු වශයෙන්) 29

පරිච්ඡේදය 3 වියදම් සහ ඵලදායිතා අනුපාතය 33
3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම් 2013, 2014 සහ 2015 වර්ෂ සමඟ සැසඳීම 35
3.2 ඵලදායිතා අනුපාතය 36
3.3 අභ්‍යන්තර විගණනය 37

පරිච්ඡේදය 4 පැහැර හරින ලද බදු 39
4.1 පැහැර හරින ලද බදු 41
4.2 පැහැර හරින ලද බදු අඩුකිරීම සඳහා සැලසුම් 42
4.3 හිඟ බදු ප්‍රමාණය 3% මට්ටමෙහි පවත්වා ගැනීම. 42

පරිච්ඡේදය 5 විගණන, අතිරේක බදු රැස්කිරීම, ආපසු ගෙවීම්, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා 43
5.1 විගණන 45
5.2 අභියාචනා 45
5.3 එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණන 46
5.4 අය ක්‍රියා මාර්ග 46
5.5 ආපසු ගෙවීම් 46
පරිච්ඡේදය 6 ජාත්‍යන්තර සබඳතා 47
6.1 ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් 49
6.2 අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වයන් 50
පරිච්ඡේදය 7 ව්‍යවස්ථා සම්පාදනය 53
7.1 වසර තුළදී පනවන ලද ව්‍යවස්ථාවන් 55
7.2 අනුමත පුණ්‍යායතන 55
7.3 ගැසට් නිවේදන 55
7.4 අර්ථ නිරූපණ කමිටුව 55
පරිච්ඡේදය 8 අනෙකුත් කාර්යයන් 57
8.1 බදු සේවා අංශය 59
8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විධානයන් සහ නිෂ්කාශන සහතික පත් පිළිබඳ විස්තර 59
8.3 මිල පැවරුම් නියෝග අංශය 59
8.4 පුහුණු අංශය 60
පරිච්ඡේදය 9 ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) 61

# I කොටස

# මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය

# පරිච්ඡේදය 1

# මානව සම්පත්

## 1.1 අනුමත කාර්ය මණ්ඩලය සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වෙන වගුව මගින් පෙන්නුම් කරයි.

**2015.12.31 දිනට කාර්ය මණ්ඩලය**

| තනතුර | අනුමත සංඛ්‍යාව | සේවයේ නිරත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| **දේශීය ආදායම් සේවය** | **1232** | **1211** | **26** |
| කොමසාරිස් ජනරාල් | 1 | 1 | - |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 9 | 8 | 1 |
| ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 22 | 21 | 1 |
| කොමසාරිස් | 90 | 87 | 3 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් /නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් | 1110 | 1089 | 21 |
| ජ්‍යෙෂ්ඨ බදු නිලධාරී/බදු නිලධාරී | - | 5 | - |
| | | | |
| **අනෙකුත් සේවා** | **1514** | **1321** | **193** |
| ***ඒකාබද්ධ සේවය*** | ***1361*** | ***1259*** | ***102*** |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | 1 | 1 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - |
| අභ්‍යන්තර විගණක | 1 | 1 | - |
| අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 1 | - |
| ගණකාධිකාරී | 5 | 5 | - |
| පරිපාලන නිලධාරී | 3 | 3 | - |
| භාෂා පරිවර්තක | 9 | 9 | - |
| සංවර්ධන නිලධාරී | 7 | 7 | - |
| පුස්තකාලයාධිපති | 2 | 1 | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 925 | 843 | 82 |
| ප්‍රවාහන නිලධාරී | 1 | - | 1 |
| රියදුරු | 86 | 86 | - |
| කාර්යාල සේවක සේවය | 319 | 301 | 18 |
| | | | |
| ***තොරතුරු සංනිවේදන තාක්ෂණ සේවය*** | ***130*** | ***48*** | ***82*** |
| අධ්‍යක්ෂ (තොරතුරු සංනිවේදන තාක්ෂණ) | 1 | - | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (තො. සං. තා.) | 5 | 4 | 1 |
| පද්ධති විශ්ලේෂක | 1 | 1 | - |
| තොරතුරු සංනිවේදන තාක්ෂණ නිලධාරී | 18 | 12 | 6 |
| සහකාර නිලධාරී (තොරතුරු සංනිවේදන තාක්ෂණ) | 105 | 31 | 74 |
| | | | |
| ***අනෙකුත්*** | ***23*** | ***14*** | ***9*** |
| ඉංජිනේරු | 1 | 1 | - |
| තාක්ෂණ නිලධාරී | 2 | - | 2 |
| ගොඩනැගිලි අධීක්ෂක | 1 | - | 1 |
| පර්යේෂණ සහකාර | 10 | 10 | - |
| සැපයුම් සහකාර | 2 | - | 2 |
| පිළිගැනීමේ නිලධාරී | 4 | 3 | 1 |
| ගබඩා භාරකරු | 2 | - | 2 |
| වඩු කාර්මික | 1 | - | 1 |
| **එකතුව** | **2746** | **2525** | **226** |

## 1.2 උසස් කිරීම්

- නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්, කල්‍යාණී දහනායක මහත්මිය 2015 මාර්තු මස 19 වන දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය ආදායම් දෙපාර්තමේනතුවේ කොමසාරිස් ජනරාල් වශයෙන් පත්කරන ලදි.

- ධම්මිකා ගුණතිලක මෙනවිය 2015 නොවැම්බර් මස 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් ධූරයට උසස් කරන ලදි.

- කොමසාරිස්වරුන් හත් දෙනෙකු ජ්‍යෙෂ්ඨ කොමසාරිස් ධූරයට පත්කරන ලදි.

- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන් නව දෙනෙකු කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.

- නියෝජ්‍ය කොමසාරිස්වරුන් පස් දෙනෙකු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.

- ජ්‍යෙෂ්ඨ බදු නිලධාරීන් අනූනව දෙනෙකු සහකාර කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.

## 1.3 විශ්‍රාම ගැනීම්

පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වසර තුළ දී විශ්‍රාම ගැනීමට යෙදුනි.

- එල්. රාමනායක මහත්මිය
  නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්
- ඩබ්. අනුලාවතී මහත්මිය
  නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්
- ඩී.එම්.එස්. දිසානායක මහතා
  ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
- පී.ජී.කේ. සමරතුංග මහතා
  ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
- ටී.එම්. දයානන්ද මහතා
  ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
- පී.එම්. දිසානායක මහතා
  ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
- ජේ.ඒ.ඒ. පරාක්‍රම මහතා
  ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
- එම්.අයි.එම්. මුසාම්මිල් මහතා
  කොමසාරිස්
- බී.එම්. ප්‍රේමරත්න මහතා
  කොමසාරිස්

**අනෙකුත් විශ්‍රාම ගැනීම්**

- නියෝජ්‍ය කොමසාරිස් - 01
- සහකාර කොමසාරිස් - 08
- රාජ්‍ය කළමනාකරණ සහකාර - 12
- පර්යේෂණ සහකාර - 01
- රියදුරු - 01
- කාර්යාල සේවක සේවය - 10
- වඩු කාර්මික - 01

**එල්. රාමනායක මහත්මිය**

එල්. රාමනායක මහත්මිය 1980 වසරේ දී තක්සේරු නිලධාරිනියක ලෙස දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වූවාය. 2015.07.02 වන දින ඇය විශ්‍රාම ගන්නා කාලවකවානුවේ දී ඇය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරියක ලෙස කටයුතු කරමින් සිටියා ය. දේශීය ආදායම් සේවයේ විවිධ තනතුරු හොබවමින් දෙපාර්තමේන්තුව වෙනුවෙන් වසර 36 ක කැපවුණු සේවා කාලපරිච්ඡේදයක් නිම කර තිබිණි. ඇයගේ ධූර කාලය තුළ 2003 වසරේ දී සිංගප්පූරුවෙහි දී පැවති බදු ප්‍රතිපත්ති සහ පරිපාලනය පිළිබඳ වැඩසටහන, 2011/2012 වසරේ පකිස්ථානයේ පැවති ජාතික කළමනාකරණ පිළිබඳ පුහුණු පාඨමාලාව ඇතුළු විදේශ බදුකරණ වැඩසටහන් කිහිපයකට සහභාගි වූවා ය. එසේම ඇය 2010 වසරේ දී ජපානයේ පැවති බදුකරණය පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය සහ 2011 වසරේ දී ඉන්දියාවේ පැවති ස්වයංකරණය සහ පද්ධති කළමනාකරණය පිළිබඳ සමුළුව වෙනුවෙන් ද දෙපාර්තමේන්තුව නියෝජනය කළා ය.

**ඩබ්. අනුලාවතී මහත්මිය**

1981 වසරේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වූ ඩබ්. අනුලාවතී මහත්මිය 2014 ජනවාරි මස 01 දින නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් ධූරයට පත් විය. ඇය 2015 දෙසැම්බර් මස 17 වන දින සේවයෙන් විශ්‍රාම ගන්නා ලදි. අනුලාවතී මහත්මිය, ඇයගේ ධූර කාලය තුළ පුහුණු වැඩ සටහන්වලට මෙන්ම 2003 වසරේ දී එක්සත් රාජධානියේ පැවති බදු ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රායෝගික ගැටළු සම්බන්ධ පුහුණු වැඩසටහන, 2007 වසරේ දී ඉන්දියාවේ පැවති විගණනය සහ විමර්ශනය පිළිබඳ විශේෂිත පුහුණු වැඩසටහන, 2013 වසරේ සිංගප්පූරුවෙහි දී පැවති ඊ - යහපාලනය සහ පරිවර්තන කළමනාකරණ (E-Govenance & Change Management) පිළිබඳ පුහුණු වැඩසටහන, 2015 වසරේ නෙදර්ලන්තයේ පැවති ඉහළ මට්ටමේ නිලධාරීන් සඳහා බදු පරිපාලනය පිළිබඳ වැඩමුළුව ඇතුළු විදේශ

බදුකරණ වැඩසටහන් කිහිපයකට සහභාගී වූවාය. 2014 වසරේ ප්‍රංශයේ පැවති මිල පැවරුම් ලෝක සංසදයේ 3 වන වාර්ෂික රැස්වීම සහ 2015 ප්‍රංශයේ පැවති 6 වැනි අන්තර් ජාතික බදු සංවාද සම්මන්ත්‍රණය වෙනුවෙන් ද දෙපාර්තමේන්තුව නියෝජනය කළා ය.

## 1.4 පුහුණු කිරීම

### 1.4.1 සේවාස්ථ පුහුණුව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය විශේෂයෙන්ම බදුකරණය සහ ගිණුම්කරණය පිළිබඳව දැනුම ඉහළ නැංවීම සහ විශ්ලේෂණාත්මක හැකියාව ඔප්නැංවීම අපේක්ෂාවෙන් සහකාර කොමසාරිස්වරුන් වෙනුවෙන් පුහුණු පාඨමාලාවන් සහ විභාග නිරන්තරයෙන් පවත්වනු ලැබේ. නිලධාරීන්ගේ අදාළ ශ්‍රේණිවල ස්ථිර කිරීමට අවශ්‍ය විවිධ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහාත් රාජකාරී ඉටුකිරීම සඳහා දැනුම ලබාගැනීම සඳහාත් අවශ්‍ය කෙරෙන විෂයය අරමුණු කොටගෙන මෙම පුහුණු පාඨමාලා සකසා ඇත.

වසර තුළ දී පුහුණු කරන ලද සහ කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පරීක්ෂණවල විස්තර පහත පරිදි දැක්වේ.

- **සහකාර කොමසාරිස්වරුන් සඳහා**

| පුහුණු පංතිය/පාඨමාලාව/පරීක්ෂණය | පුහුණුකරුවන්ගේ සංඛ්‍යාව | |
|---|---|---|
| පලමු දෙපාර්තමේන්තු පරීක්ෂණය - III ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් | 424 | |
| දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය - III ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් | 60 | |
| දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය - III ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් | පළමු ප්‍රයත්නය | 52 |

- **සම්මන්ත්‍රණ, වැඩමුළු යනාදිය**

| විෂය | වසර තුළ පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු ගණන | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ ලිපිගොනු විගණනය කිරීම සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන | 1 | 32 |
| රැඳවුම් බදු සම්බන්ධ සම්මන්ත්‍රණය | 6 | 272 |
| අලුතින් බඳවාගන්නා ලද කළමනාකරණ සහකාරකයින් සඳහා වැඩමුළුව | 6 | 548 |

### 1.4.2 විදේශ පුහුණුව

බදු පරිපාලකයින් වශයෙන් නිලධාරීන්ගේ ඉහළ වෘත්තීය මට්ටම් පවත්වාගෙන යාම පිණිස වෙනත් රටවල බදු නීති පරිපාලනය සහ මනා පරිචයන්හි කරන ලද ප්‍රගමනයන්ට ඔවුන් නැඹුරු කරවීමේ අරමුණ පෙරදැරිව විදේශයන්හි පැවති පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගිවීමට ඉඩ සැලසෙන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙනුවෙන් අවශ්‍ය කටයුතු සලසා දෙන ලදි.

එසේ විදේශයන් සඳහා යවන ලද නිලධාරීන් සහ ඔවුන් සහභාගී වූ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | නිලධාරියාගේ නම සහ තනතුර | වැඩසටහන/සම්මන්ත්‍රණය/ වැඩමුළුව | පුහුණුව ලැබූ රට | කාලය |
|---|---|---|---|---|
| 1 | කේ. දහනායක මහත්මිය<br>කොමසාරිස් ජනරාල් | 6 වන අන්තර්ජාතික බදු සංවාද සම්මන්ත්‍රණය | පැරිසිය | 2015.06.29 – 2015.07.05 |
| 2 | කේ. දහනායක මහත්මිය<br>කොමසාරිස් ජනරාල් | “ඊ- යහපාලනය” සම්බන්ධ පුහුණු වැඩසටහන සඳහා මැලේසියාවේ දේශීය ආදායම් මණ්ඩලයේ (IRBM) අවසන් උත්සවය සඳහා සහභාගී වීම | මැලේසියාව | 2015.09.17 – 2015.09.19 |
| 3 | කේ.ජී.ජී. අබේරත්න මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | දැනටමත් ක්‍රියාත්මකව පවත්නා වූ සැකසුම් මධ්‍යස්ථානයක් නැරඹීම. | මැලේසියාව | 2015.03.17 – 2015.03.19 |

| | | | | |
|---|---|---|---|---|
| 4 | කේ.ඒ.ජී. අබේරත්න මහතා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | උප ජාතික බදුකරණය සම්බන්ධ වැඩමුළුව | පකිස්ථානය | 2015.10.03 – 2015.10.09 |
| 5 | ඩබ්. අනුලාවති මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 6 වන අන්තර්ජාතික බදු සංවාද සම්මන්ත්‍රණය | පැරිසිය | 2015.06.29 – 2015.07.05 |
| 6 | ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 6 වන අන්තර්ජාතික බදු සංවාද සම්මන්ත්‍රණය | පැරිසිය | 2015.06.29 – 2015.07.05 |
| 7 | ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | සාමුද්‍රික සේද මාවතේ රටවල් සඳහා සමුද්‍ර කළමනාකරණය සහ නිල් ආර්ථික සංවර්ධනය සම්බන්ධ අමාත්‍යාංශයීය වැඩමුළුව | චීනය | 2015.10.30 – 2015.11.11 |
| 8 | ඩී.එම්.එස්. දිසානායක මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | එකතු කළ අගය මත බදු වැඩමුළුව | ඔස්ට්‍රියාව | 2015.04.13 – 2015.04.17 |
| 9 | එම්.ජී. සෝමචන්ද්‍ර මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | එකතු කළ අගය මත බදු වැඩමුළුව | ඔස්ට්‍රියාව | 2015.04.13 – 2015.04.17 |
| 10 | සී.එච්. වීරසිංහ මහත්මිය ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා සම්බන්ධ සමුළුව | චීනය | 2015.10.13 – 2015.11.06 |
| 11 | පී.කේ.ජී. සමරතුංග මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 6 වන අන්තර්ජාතික බදු සංවාද සම්මන්ත්‍රණය | පැරිසිය | 2015.06.29 – 2015.07.05 |
| 12 | ඕ.පී.පී.කේ. සිරිසේන මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | දැනටමත් ක්‍රියාත්මකව පවත්නා වූ සැකසුම් මධ්‍යස්ථානයක් නැරඹීම. | මැලේසියාව | 2015.03.17 – 2015.03.19 |
| 13 | ඒ.ඒ. දයාරත්න මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ඩිජිටල් ආර්ථිකයේ බදුකරණ ගැටළු සම්බන්ධ සාර්ක් සමුළුව | ඉන්දියාව | 2015.03.16 – 2015.03.21 |
| 14 | එච්.එම්.ඩබ්.සී. බණ්ඩාර මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 36 වැනි CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය සහ 13 වැනි මහා සභාවාරය | මැලේසියාව | 2015.11.15 – 2015.11.21 |
| 15 | ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා කොමසාරිස් | 36 වැනි CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය සහ 13 වැනි මහා සභාවාරය | මැලේසියාව | 2015.11.15 – 2015.11.21 |
| 16 | එම්.ජේ. ගුණසිරි මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 6 වන අන්තර්ජාතික බදු සංවාද සම්මන්ත්‍රණය | පැරිසිය | 2015.06.29 – 2015.07.05 |
| 17 | ඩී. රංගල්ලමහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 6 වන අන්තර්ජාතික බදු සංවාද සම්මන්ත්‍රණය | පැරිසිය | 2015.06.29 – 2015.07.05 |
| 18 | ආර්.එම්. ජයසිංහ මහතා කොමසාරිස් | එකතු කළ අගය මත බදු වැඩමුළුව | ඔස්ට්‍රියාව | 2015.04.13 – 2015.04.17 |
| 19 | ආර්.එස්. සමරනායක මහතා කොමසාරිස් | IPSAS සහ IFRS ප්‍රමිත, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම | එක්සත් රාජධානිය | 2015.11.29 – 2015.12.11 |
| 20 | එස්.එස්.ඩී. වීරසේකර මහතා කොමසාරිස් | එකතු කළ අගය මත බදු වැඩමුළුව | ඔස්ට්‍රියාව | 2015.04.13 – 2015.04.17 |
| 21 | එම්.එස්.එම්. සියාන් මහතා කොමසාරිස් | දැනටමත් ක්‍රියාත්මකව පවත්නා වූ සැකසුම් මධ්‍යස්ථානයක් නැරඹීම. | මැලේසියාව | 2015.03.17 – 2015.03.19 |
| 22 | ටී.ජී.ඩී.එස්. ජයවර්ධන මහත්මිය කොමසාරිස් | IRBM – IBFD මුදල් විශුද්ධිකරණය සහ බදු මගහැරීම වැළැක්වීමේ පාඨමාලාව | මැලේසියාව | 2015.04.12 – 2015.04.18 |
| 23 | ජී.ඩී.එස්. ජයරත්න මහතා කොමසාරිස් | බදු පරිපාලනය සඳහා ශක්‍යතා ගොඩනැගීම | ජපානය | 2015.12.07 – 2015.12.09 |
| 24 | එන්.එම්. එම්. මිෆ්ලි මහතා කොමසාරිස් | IRBM – IBFD මුදල් විශුද්ධිකරණය සහ බදු මගහැරීම වැළැක්වීමේ පාඨමාලාව | මැලේසියාව | 2015.04.12 – 2015.04.18 |
| 25 | එල්.එම්.සී. වීරකෝන් මහත්මිය කොමසාරිස් | LHDNM - OECD බදු අනුකූලතාවය ශක්තිමත් කිරීම සඳහා සැලසුම් සාධන පත්‍ර මගින් අනුකූලතාවය | මැලේසියාව | 2015.01.11 – 2015.01.17 |
| 26 | එච්.ඩබ්.එන්.කේ. තල්අරඹ මහත්මිය කොමසාරිස් | LHDNM - OECD බදු අනුකූලතාවය ශක්තිමත් කිරීම සඳහා සැලසුම් සාධන පත්‍ර මගින් අනුකූලතාවය | මැලේසියාව | 2015.01.11 – 2015.01.17 |
| 27 | එච්.එම්.සී.එම්. හේරත් මහත්මිය කොමසාරිස් | සාමුද්‍රික සේද මාවතේ රටවල් සඳහා සමුද්‍ර කළමනාකරණය සහ නිල් ආර්ථික සංවර්ධනය සම්බන්ධ අමාත්‍යාංශයීය වැඩමුළුව | චීනය | 2015.10.30 – 2015.11.11 |
| 28 | පී.ජී.ජේ. ගමගේ මහතා කොමසාරිස් | ඩිජිටල් ආර්ථිකයේ බදුකරණ ගැටළු සම්බන්ධ සාර්ක් සමුළුව | ඉන්දියාව | 2015.03.16 – 2015.03.21 |

| | | | | |
|---|---|---|---|---|
| 29 | පී.ජී.ජේ. ගමගේ මහතා<br>කොමසාරිස් | සාමුද්‍රික සේද මාවතේ රටවල් සඳහා සමුද්‍ර කළමනාකරණය සහ නිල් ආර්ථික සංවර්ධනය සම්බන්ධ අමාත්‍යාංශයීය වැඩමුළුව | චීනය | 2015.10.30 – 2015.11.11 |
| 30 | කේ.ජී.එස්. රාජිනී මහත්මිය<br>කොමසාරිස් | දැනටමත් ක්‍රියාත්මකව පවත්නා වූ සැකසුම් මධ්‍යස්ථානයක් නැරඹීම | මැලේසියාව | 2015.03.17 – 2015.03.19 |
| 31 | ජේ. පතිරණ මහත්මිය<br>කොමසාරිස් | ඩිජිටල් ආර්ථිකයේ බදුකරණ ගැටළු සම්බන්ධ සාර්ක් සමුළුව. | ඉන්දියාව | 2015.03.16 – 2015.03.21 |
| 32 | එස්.සී. අතුකෝරාල මහතා<br>කොමසාරිස් | ඩිජිටල් ආර්ථිකයේ බදුකරණ ගැටළු සම්බන්ධ සාර්ක් සමුළුව | ඉන්දියාව | 2015.03.16 – 2015.03.21 |
| 33 | එස්. ලියනගේ මහත්මිය<br>කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා සම්බන්ධ සමුළුව | චීනය | 2015.10.13 – 2015.11.06 |
| 34 | ඩී.ආර්.කේ. පන්නිලවිතාන මහත්මිය<br>කොමසාරිස් | සාමුද්‍රික සේද මාවතේ රටවල් සඳහා සමුද්‍ර කළමනාකරණය සහ නිල් ආර්ථික සංවර්ධනය සම්බන්ධ අමාත්‍යාංශයීය වැඩමුළුව | චීනය | 2015.10.30 – 2015.11.11 |
| 35 | එල්.ආර්. පෙරේරා මහතා<br>කොමසාරිස් | ඩිජිටල් ආර්ථිකයේ බදුකරණ ගැටළු සම්බන්ධ සාර්ක් සමුළුව. | ඉන්දියාව | 2015.03.16 – 2015.03.21 |
| 36 | බී. හපුතන්ත්‍රී මහතා<br>කොමසාරිස් | උප ජාතික බදුකරණය සම්බන්ධ වැඩමුළුව | පකිස්ථානය | 2015.10.03 – 2015.10.09 |
| 37 | යූ.ඩී.එන්. ජයවීර මහතා<br>කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා සම්බන්ධ සමුළුව | චීනය | 2015.10.13 – 2015.11.06 |
| 38 | ආර්.ජේ.එස්. රාජපක්ෂ මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | සාමුද්‍රික සේද මාවතේ රටවල් සඳහා සමුද්‍ර කළමනාකරණය සහ නිල් ආර්ථික සංවර්ධනය සම්බන්ධ අමාත්‍යාංශයීය වැඩමුළුව | චීනය | 2015.10.30 – 2015.11.11 |
| 39 | එස්.එම්. වික්‍රමාරච්චි මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | බහුජාතික ව්‍යවසාය විගණනය සහ විමර්ශනය සම්බන්ධ SAARC පුහුණු සම්මන්ත්‍රණය | පකිස්ථානය | 2015.05.03 – 2015.05.09 |
| 40 | එම්.එන්. පුෂ්පලතා මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් | මිල පැවරුම් ප්‍රතිපත්ති සහ පරිචය | අමෙරිකා එක්සත් ජනපදය | 2015.05.29 – 2015.06.07 |
| 41 | ටී.එම්.එස්.එම්. තෙන්නකෝන් මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් | මිල පැවරුම් ප්‍රතිපත්ති සහ පරිචය | අමෙරිකා එක්සත් ජනපදය | 2015.05.29 – 2015.06.07 |
| 42 | එච්.එච්.ටී. ප්‍රියන්ති මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් | මිල පැවරුම් ප්‍රතිපත්ති සහ පරිචය | අමෙරිකා එක්සත් ජනපදය | 2015.05.29 – 2015.06.07 |
| 43 | ඩී.එම්.එන්.ඩී. දසනායක මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා සම්බන්ධ සමුළුව | චීනය | 2015.10.13 – 2015.11.06 |
| 44 | එච්.එස්. සමන්ත කුමාර මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | IRBM – IBFD මූල්‍ය වෙළෙඳපොළ බදුකරණය | මැලේසියාව | 2015.10.25 – 2015.10.31 |
| 45 | ආර්.එම්.එන්.කේ. රත්නායක මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා සම්බන්ධ සමුළුව | චීනය | 2015.10.13 – 2015.11.06 |
| 46 | කේ.ජී.ජේ.එන්. දේශප්‍රිය මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | පොදු රාජ්‍ය මණ්ඩලීය බදු පරිපාලකයින්ගේ සංගමයේ පුහුණු වැඩසටහන | එක්සත් රාජධානිය | 2015.07.24 – 2015.09.06 |
| 47 | ආර්. කහවල මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා සම්බන්ධ සමුළුව | චීනය | 2015.10.13 – 2015.11.06 |
| 48 | ජේ.ජේ.ආර්. ද සොයිසා මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | LHDNM - OECD: High Net - Worth Individuals බදුකැණය | මැලේසියාව | 2015.11.01 – 2015.11.07 |
| 49 | එම්.පී.එස්. දමයන්ති මෙනවිය<br>නියෝජ්‍ය කොමසාරිස් | LHDNM - OECD: High Net - Worth Individuals බදුකැණය | මැලේසියාව | 2015.11.01 – 2015.11.07 |
| 50 | ඩී.ජේ.සී. දිසානායක මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් | සාමුද්‍රික සේද මාවතේ රටවල් සඳහා සමුද්‍ර කළමනාකරණය සහ නිල් ආර්ථික සංවර්ධනය සම්බන්ධ අමාත්‍යාංශයීය වැඩමුළුව | චීනය | 2015.10.30 – 2015.11.11 |
| 51 | ආර්.ආර්. පිටදෙනිය මහත්මිය<br>සහකාර කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා සම්බන්ධ සමුළුව | චීනය | 2015.10.13 – 2015.11.06 |
| 52 | එච්.බී.ජේ. චන්ද්‍රානි මහත්මිය<br>සහකාර කොමසාරිස් | සාමුද්‍රික සේද මාවතේ රටවල් සඳහා සමුද්‍ර කළමනාකරණය සහ නිල් ආර්ථික සංවර්ධනය සම්බන්ධ අමාත්‍යාංශයීය වැඩමුළුව | චීනය | 2015.10.30 – 2015.11.11 |

| | | | | |
|---|---|---|---|---|
| 53 | ජේ.එච්.එස්.කේ. ජයතිලක මහත්මිය<br>සහකාර කොමසාරිස් | සංවර්ධනය වන රටවල් සඳහා බදු පරිපාලනය සහ බදු සේවා සම්බන්ධ සමුළුව | චීනය | 2015.10.13 – 2015.11.06 |
| 54 | එම්.වී.ඒ. ජයසිරි මහතා<br>සහකාර කොමසාරිස් | පොදු රාජ්‍ය මණ්ඩලීය බදු පරිපාලකයින්ගේ සංගමයේ පුහුණු වැඩසටහන | එක්සත් රාජධානිය | 2015.07.24 – 2015.09.06 |
| 55 | එස්.ඩබ්.පී.වයි. සිල්වා මහතා<br>සහකාර කොමසාරිස් | IRBM - IBFD: මුල්‍ය වෙළෙඳ පොළ සම්බන්ධ බදුකරණය | මැලේසියාව | 2015.10.25 – 2015.10.31 |
| 56 | එච්.ඩී.ආර්.පී. සිරිවර්ධන මහත්මිය<br>සහකාර කොමසාරිස් | බහුජාතික ව්‍යවසාය විගණනය සහ විමර්ශනය සම්බන්ධ SAARC පුහුණු සම්මන්ත්‍රණය | පකිස්ථානය | 2015.05.03 – 2015.05.09 |
| 57 | එම්.අයි.යූ.ඩී.එස්. ධර්මවර්ධන මහත්මිය<br>සහකාර කොමසාරිස් | බහුජාතික ව්‍යවසාය විගණනය සහ විමර්ශනය සම්බන්ධ SAARC පුහුණු සම්මන්ත්‍රණය | පකිස්ථානය | 2015.05.03 – 2015.05.09 |
| 58 | ටී. ඉන්දුවංශ මහත්මිය<br>ඉංජිනේරු | දැනටමත් ක්‍රියාත්මකව පවත්නා වූ සැකසුම් මධ්‍යස්ථානයක් නැරඹීම | මැලේසියාව | 2015.03.17 – 2015.03.19 |
| 59 | ඒ.ඩබ්.ජී. ගුරුගේ මහතා<br>ප්‍රධාන මුල්‍ය නිලධාරී | ශ්‍රී ලාංකික මුල්‍ය කළමනාකරු සඳහා විදේශ අධ්‍යාපන වැඩසටහන | එක්සත් රාජධානිය | 2015.11.03 – 2015.11.13 |
| 60 | ඒ.පී. කොඩිකාර මහත්මිය<br>ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලාංකික මුල්‍ය කළමනාකරු සඳහා විදේශ අධ්‍යාපන වැඩසටහන | එක්සත් රාජධානිය | 2015.11.03 – 2015.11.13 |

### 1.4.3 සාමාන්‍ය ක්‍රමය යටතේ ලබාදෙන ලද විදේශ පුහුණු

බදු පරිපාලනය සම්බන්ධ වැඩමුළුව වසර තුළ දී නෙදර්ලන්තයේ දී පවත්වන ලද අතර, ඒ සඳහා දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීහු සහභාගි වූහ.

### 1.4.4 FMRP මගින් ලබාදෙන ලද විදේශ පුහුණුව

FMRP හි අනුග්‍රහය යටතේ සිංගප්පූරුවේ දී පවත්වන ලද "ඊ - යහපාලනය සහ පරිවර්තන කළමනාකාරිත්වය" හා සම්බන්ධ වැඩසටහන මෙම වසර තුළ දී පවත්වන ලදී. ඒ අනුව, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) හා සම්බන්ධ විශේෂ පුහුණු වැඩසටහන සඳහා නිලධාරීන් 291 දෙනෙකු සහභාගි වන ලදී.

# II කොටස

# බදු පරිපාලනය

# පරිච්ඡේදය 2

# ආදායම් රැස්කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය තුළ දී රු.560,422,362,100/- ක ශුද්ධ ආදායම් ප්‍රමාණයක් රැස් කර ඇත. (ඊට මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යටතේ ගිණුම් ගතවන සමාජ වගකීම් බද්ද, පළාත් සභාවලට මුළුමනින්ම මාරු කරනු ලබන මුද්දර බද්ද සහ පළාත් සභාවලට මාරු කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්ද යන රැස්කිරීම් වලින් 1/3 ක කොටස ද ඇතුළත් වේ.) විවිධ බදු රැස්කිරීම් සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ලිපිගොනු සංඛ්‍යාවේ එකතුව 2015.12.31 දින වන විට 690,405 ක්ව පැවතිණි.

## 2.1 බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව

වසර අවසාන වන විට බදු ගෙවීම සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව පහත අංක 01 වගුවෙහි දක්වා ඇත.

| වගුව 01 – 2015.12.31 දිනට බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව | | |
|---|---|---|
| **ආදායම් බද්ද** | | |
| **සංස්ථාපිත** | | |
| වාසික සමාගම් | 45,295 | |
| නිර්වාසික සමාගම් | 1,778 | |
| රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු ආයතන | 81 | 47,154 |
| **සංස්ථාපිත නොවන** | | |
| පුද්ගලයින් | 135,170 | |
| හවුල් ව්‍යාපාර | 11,439 | |
| පුද්ගල මණ්ඩල ආදිය | 1,730 | |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තයන් (2015.03.31) දිනට* | 426,496 | 574,835 |
| **ආදායම් බදු ගෙවන මුළු සංඛ්‍යාව** | | **621,989** |
| **අනෙකුත් බදු ගෙවන්නන්** | | |
| ආර්ථික සේවා ගාස්තු (ESC) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සහ හවුල් ව්‍යාපාර | 4,024 | |
| එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 15,696 | |
| මුල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 229 | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 21,627 | |
| මුල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 229 | |
| ඔට්ටු බදු ලිපිගොනු සංඛ්‍යාව | 622 | |
| සූදු බදු ලිපිගොනු සංඛ්‍යාව | 5 | |
| **මුළු අනෙකුත් බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **42,432** |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සේවා යෝජකයන්** | 13,749 | |
| පොළිය මත රඳවාගැනීමේ බදු (රඳවාගැනීමේ නියෝජිතයන්)*** | 3,424 | |
| නිශ්චිත ගාස්තු යටතේ රඳවාගනීමේ බදු (විධිමත් මාසික උපලේඛන සැපයුම්කරුවෝ) | 84 | |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 334 | |
| මුද්දර බදු (විධිමත් මාසික උපලේඛනගත සැපයුම්කරුවන්) | 8,393 | **25,984** |
| **2015.12.31 දිනට මුළු ලිපිගොනු/බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව** | | **690,405** |

** රජයේ සේවකයන් 143,178 ක සංඛ්‍යාවක් ඇතුළත් වේ.*

***රාජ්‍ය ආයතන 1,337 සංඛ්‍යාවක ඇතුළත් වේ.*

## 2.2 මුළු ආදායම් රැස්කිරීම

වර්ෂය සඳහා මුළු ආදායම් රැස්කිරීම රුපියල් මිලියන 560,422 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 46,261 ක් හෙවත් 9% ක ඉහළ යාමක් පෙන්නුම් කරයි. බදු අනුකූලතාව වර්ධනය සඳහා පහසුකම් සැලසීමට සහ බලාත්මක කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය විසින් ගන්නා ලද පුළුල් ක්‍රියාමාර්ග හේතුකොටගෙන ප්‍රධාන වශයෙන් ම මෙම ජයග්‍රහණයන් සාක්ෂාත් කර ගැනීමට හැකි විය. බදු ගෙවන්නන් හඳුනාගැනීම, බදු බැඳියාවන් තක්සේරු කිරීම සහ බදු රැස්කිරීම කඩිනම් කිරීම තුළින් ඉහත සඳහන් කරන ලද වැඩිවීම කෙරෙහි මග පෑදිනි.

රජයේ ආදායමට වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැරූ දායකත්වයෙහි ප්‍රතිශතය 38.52% කි. අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ගය යටතේ වන ආදායම සසඳා බැලූ විට, ආදායමේ මුළු රැස්කිරීම, 104.35% ක අගයක් පෙන්වයි.

ආදායම් බදු රැස්කිරීම මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ 37.33% සිට 2015 වසරේ 45.76% දක්වා ඉහළ ගොස් අතර, එහි නාමික අගයෙහි පෙර වසරෙහි වූ රුපියල් මිලියන 191,960 සිට 2015 වසරේ රුපියල් මිලියන 256,435 දක්වා 25.14 කින් ඉහළ ගොස් ඇත. කලින් වසර හා සසඳා බලන කළ, සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බද්දෙන් සහ උපයන විට ගෙවීමේ බද්දෙන් ලද ආදායම වැඩි වී ඇති අතර පොළිය මත රඳවාගැනීමේ බදු රැස්කිරීම 2015 වසර තුළ දී අඩු වී ඇත. සංස්ථාපිත ආදායම් බද්දෙන් ලද ආදායම 2014 වසරේ රුපියල් මිලියන 81,644 සිට රුපියල් මිලියන 139,395 දක්වා නාමික අගය 70.74 කින් වැඩි වී ඇත. 2015 වසරේ අයවැය යෝජනා මගින් එක් වරක් පමණක් අයකරන බද්දක් ලෙස හඳුන්වා දෙන ලද සුපිරි වාසි බද්ද මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය.

එකතු කළ අගය මත බදු රැස් කිරීම පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 23,678 කින් අඩු විය. එසේ අඩු වීම සඳහා හේතුව කාර්තුමය පිරිවැටුම රු. මිලියන 3 සිට රු. මිලියන 3.75 දක්වා පුළුල් කිරීම සහ එ.අ.බ. අනුප්‍රමාණය 11% දක්වා අඩු කිරීම විය හැකිය.

අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ග රැස්කිරීම් හි අගයන් 02 වැනි වගුවෙහි දක්වා ඇති අතර, එය 01 වන සටහනින් නිරූපණය කෙරේ. වර්ෂය තුළ මූල්‍ය ප්‍රවාහය 03 වන වගුවෙහි දක්වා ඇති අතර එය 02 වන සටහනෙන් නිරූපණය කෙරේ.


**වගුව 02 - මුළු ආදායම රැස්කිරීම - 2015**

| බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව රු. (සංශෝධිත) | ආදායම් රැස්කිරීම රු. | රැස්කිරීම් ඇස්තමේන්තුවේ % ක් ලෙස | රැස්කිරීම් මුළු ආදායමේ % ක් ලෙස |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 246,100,000,000 | 256,434,940,539 | 104.20% | 45.76% |
| ආර්ථික සේවා ගාස්තුව | 6,500,000,000 | 6,148,447,689 | 94.59% | 1.10% |
| ඔට්ටු හා සූදු බද්ද | 2,200,000,000 | 831,922,843 | 37.81% | 0.15% |
| කොටස් ගනුදෙනු බද්ද | 2,300,000,000 | 1,394,916,707 | 60.65% | 0.25% |
| එකතු කළ අගය මත බද්ද | 230,000,000,000 | 214,236,985,484 | 93.15% | 38.23% |
| භාණ්ඩ හා සේවා බද්ද | - | 881,931 | - | 0.00% |
| පිරිවැටුම් බද්ද | - | 15,770,891 | - | 0.00% |
| ජාතික ආරක්ෂක බද්ද | - | 11,633,297 | - | 0.00% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 1,200,000,000 | 753,314,770 | 62.78% | 0.13% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 48,000,000,000 | 67,911,062,200 | | 12.12% |
| මුද්දර බද්ද | - | 11,595,885,325 | | 2.07% |
| ඉඩම් බද්ද | 750,000,000 | 1,066,637,564 | 142.22% | 0.19% |
| සමාජ වගකීම් බද්ද | - | 19,962,860 | | 0.00% |
| **මුළු ආදායම් රැස්කිරීම** | **537,050,000,000** | **560,422,362,100** | **104.35%** | **100.00%** |

* පළාත් සභාවලට මාරුකරන ලද ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම රු. 23,972,290,236 කි.


** පළාත් සභාවලට මාරුකරන ලද මුද්දර බදු රැස්කිරීම රු. 11,595,885,325 කි.

*** රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත මාරුකරන ලද සමාජ ආරක්ෂණ බදු රැස්කිරීම රුපියල් 19,962,860 කි.





## 2.3 මුළු ආදායම් ප්‍රවාහය

| වගුව 03 - මුළු ආදායම් ප්‍රවාහය - 2015 | | |
|---|---|---|
| මාසය | ආදායම් රැස් කිරීම (ස.ආ.බ. ඇතුළුව) රු. | සමුච්චිත ආදායම් රැස් කිරීම් රු. |
| ජනවාරි | 38,524,148,133.85 | 38,524,148,133.85 |
| පෙබරවාරි | 39,500,951,838.77 | 78,025,099,972.62 |
| මාර්තු | 33,664,965,480.99 | 111,690,065,453.61 |
| අප්‍රේල් | 39,692,767,353.51 | 151,382,832,807.12 |
| මැයි | 42,533,728,948.32 | 193,916,561,755.44 |
| ජූනි | 34,831,656,539.84 | 228,748,218,295.28 |
| ජූලි | 37,023,510,467.02 | 265,771,728,762.30 |
| අගෝස්තු | 49,536,447,199.71 | 315,308,175,962.01 |
| සැප්තැම්බර් | 53,465,491,384.23 | 368,773,667,346.24 |
| ඔක්තෝබර් | 56,870,721,795.72 | 425,644,389,141.96 |
| නොවැම්බර් | 69,649,375,880.31 | 495,293,765,022.27 |
| දෙසැම්බර් | 65,128,597,078.06 | **560,422,362,100.33** |




## 2.4 ආදායම පෙර වසර සමඟ සැසඳීම

| බදු වර්ගය | 2015 ආදායම් රැස් කිරීම් රු. | 2014 ආදායම් රැස් කිරීම් රු. | රැස් කිරීමේ අඩුවීම හෝ වැඩිවීම (%) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ආදායම් බදු | 256,434,940,539 | 191,960,050,670 | 25.14% |
| ආර්ථික සේවා ගාස්තු | 6,148,447,689 | 6,154,508,746 | -0.10% |
| ඔට්ටු හා සූදු බද්ද | 831,922,843 | 815,175,141 | 2.01% |
| කොටස් ගනුදෙනු බද්ද | 1,394,916,707 | 2,048,048,604 | -46.82% |
| එකතු කළ අගය මත බද්ද | 214,236,985,484 | 237,915,432,907 | -11.05% |
| භාණ්ඩ හා සේවා බද්ද | 881,931 | 3,459,764 | -292.29% |
| පිරිවැටුම් බද්ද | 15,770,891 | 472,185,201 | -2894.03% |
| ජාතික ආරක්ෂක බද්ද | 11,633,297 | 13,772,420 | -18.39% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 753,314,770 | 841,828,584 | -11.75% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 67,911,062,200 | 65,353,982,522 | 3.91% |
| මුද්දර බද්ද | 11,595,885,325 | 7,918,141,767 | 46.45% |
| ඉඩම් බද්ද | 1,066,637,564 | 579,471,620 | 45.67% |
| සමාජ වගකීම් බද්ද | 19,962,860 | 84,655,276 | -76.42% |
| **මුළු ආදායම් එකතුව** | **560,422,362,100** | **514,160,713,222** | **9.00%** |




## 2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම

2015 අයවැය යෝජනාවලට අනුකූලව පනවා ඇති ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට කරන ලද සංශෝධන ප්‍රකාර, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් රැස්කරනු ලබන පහත සඳහන් බදු පළාත් සභාවලට මාරුකරන ලදි.

| | |
|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 33.33% |
| මුද්දර බද්ද | 100% |

පළාත් සභාවලට මාරුකරන ලද මුදල සහ දෙපාර්තමේන්තුව විසින් අදාළ බදුවල මුළු රැස්කිරීම් ප්‍රමාණය 04 වන වගුවෙහි දැක්වේ.

**වගුව 04 - පළාත් සභාවලට බදු ආදායම් රැස්කිරීම් - 2015**

| | මුළු එකතුව රු. | පළාත් සභාවලට මාරු කළ ප්‍රමාණය රු. | % |
|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 67,911,062,200 | 23,972,290,236 | 33.33% |
| මුද්දර බද්ද | 11,595,885,325 | 11,595,885,325 | 100% |

## 2.6 ආදායම් රැස්කිරීම් - ස්ව තක්සේරු පදනම සහ අනෙකුත් පදනම්

වසර තුළ රැස්කරන ලද සමස්ත ආදායමෙන් (ආනයන මත එකතු කළ අගය මත බදු හා ආනයන මත ජාතිය ගොඩනැගීමේ බදු හැර) ස්ව තක්සේරු පදනම යටතේ ගෙවීම් සමස්ත වටිනාකමට සම්පූර්ණයෙන්ම වාගේ දායකත්වය ලබාදුනි. තව ද, නිල තක්සේරු ආකාරයෙන් ආදායම් රැස්කිරීම මුළු එකතුවෙන් සියයට 3 ක් පමණක් විය. 2014 වසරේදී නිල තක්සේරු ආකාරයෙන් ආදායම් රැස්කිරීම 4% විය. ස්ව තක්සේරු පදනම යටතේ ආදායම් රැස්කිරීම සඳහා තම මෙහෙවරෙහි ප්‍රධාන කොටස ලෙස ස්වේච්ඡා බදු අනුකූලතාවය දිරිගැන්වීම පිණිස ගන්නා ලද ප්‍රයත්නයන්ගේ සාර්ථකත්වය මෙයින් පිළිඹිබු වේ. මේ පිළිබඳ සංසන්දනාත්මක අගයයන් 05 වැනි වගුවෙහි දක්වා ඇත.

| වගුව 05 - ස්වයං තක්සේරු සහ වෙනත් පදනම් මත රැස්කිරීම් පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2013 (රු. '000) | | 2014 (රු.'000) | | 2015 (රු.'000) | |
| | ස්වතක්සේරු | වෙනත් | ස්වතක්සේරු | වෙනත් | ස්වතක්සේරු | වෙනත් |
| ආදායම් බද්ද | 189,657,462 | 9,412,569 | 181,977,746 | 9,982,305 | 256,434,940 | 11,539,082 |
| එකතු කළ අගය මත බද්ද (ආනයන මත එ.අ.බ. හැර) | 117,622,485 | 3,474,351 | 129,744,521 | 5,890,227 | 130,510,553 | 4,688,017 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (ආනයන මත ජා.ගො.බ. හැර) | 35,840,240 | 1,113,648 | 39,800,767 | 1,791,628 | 41,419,548 | 1,445,941 |
| වෙනත් | 15,849,578 | 535,568 | 143,486,800 | 1,486,719 | 113,907,066 | 477,215 |
| **එකතුව** | **358,969,765** | **14,536,136** | **495,009,834** | **19,150,879** | **542,272,107** | **18,150,255** |
| සමස්ත ආදායමට % (ආනයන මත එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද හැර) | 96% | 4% | 96% | 4% | 97% | 3% |

## 2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය


2015 වසරේ රජයේ ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙන්ම පසුගිය වසර හතරක කාලය තුළ එහි ප්‍රවණතාවයන් 06 වන වගුවෙන් පෙන්වයි. එසේම, මෙම දායකත්වයන් 04 වන සටහනින් නිරූපණය කෙරේ. 2015 වසරේ රජයේ ආදායම රුපියල් මිලියන 1,454,878 (මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව - 2015) දක්වා වැඩි වී ඇත්තේ මුළු රාජ්‍ය ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීම්වල දායකත්වය 38.52% ක් ලෙස වාර්තා කරමිනි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අඛණ්ඩව පහළ ගොස් ඇති අතර, එය 2015 වසරේ දී සියයට 5.01 ක් ලෙස සටහන් වේ. මෑත කාලයේ දී බදු දිරි දීමනා, විරාම, නිදහස් කිරීම් සහ සහනදායී බදු අනුප්‍රමාණයන් හඳුන්වාදීම එම ප්‍රතිශතයන්හි අඩුවීම සඳහා හේතුව විය හැකිය.

**වගුව 06 - ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය.**

| වර්ෂය | රජයේ ආදායම (රු. මිලියන) | දේශීය ආදායම් රැස් කිරීම (රු. මිලියන) | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීමේ ප්‍රතිශතය | ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ දළ ජාතික නිෂ්පාදන (රු. මිලියන) | දළ ජාතික නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2011 | 967,862 | 443,830 | 45.86% | 6,544,009 | 6.78% |
| 2012 | 1,051,461 | 443,456 | 42.18% | 7,582,376 | 5.85% |
| 2013 | 1,137,447 | 492,539 | 43.30% | 8,674,230 | 5.68% |
| 2014 | 1,195,206 | 514,161 | 43.02% | 9,784,672 | 5.25% |
| 2015 | 1,454,878 | 560,422 | 38.52% | 11,183,220 | 5.01% |

මූලාශ්‍රය: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (වාර්ෂික වාර්තාව) ශ්‍රී ලංකා මහ බැංකුව (වාර්ෂික වාර්තාව)



## 2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය

ආදායම් වාර්තා නිසි වේලාවට සැපයීම මගින් සහ ස්ව තක්සේරු මත පදනම්ව බදු ගෙවීම සඳහා බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය වැඩිදියුණු කිරීමේ වැඩ සටහන් වර්ෂය පුරා අඛණ්ඩව ක්‍රියාත්මකව පැවතිණි. වරප්‍රසාද කාඩ්පත් ලබාදීම (රන් සහ රිදී කාඩ්පත්) මෝටර් රථ ආනයනය මත බදු සහන ප්‍රදානය කිරීම, කලින් ගෙවීම් කරන බදු සම්බන්ධයෙන් වට්ටම් ලබාදීම වැනි බදු නීතින් කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාවය ඉහළ නැංවීම පිණිස තනි පුද්ගල බදු ගෙවන්නන් සඳහා ප්‍රතිලාභ ප්‍රදානය කිරීම අඛණ්ඩව සිදුකරන ලදි.

ඒ අනුව 2014/2015 තක්සේරු වර්ෂය තුළ දී නියමිත දින සංස්ථාපිත නොවන අංශයේ ආදායම් බදු වාර්තා කිරීමේ ප්‍රතිශතය 47% ක් වූ අතර නියමිත දිනයෙන් එක් මාසයක් තුළ එය 62% දක්වා ඉහළ ගොස් ඇත. නියමිත දිනෙන් මාස දෙකක් තුළ අනුකූලතා අනුප්‍රමාණය මෙම අංශයෙහි 72% ක් විය.

සංස්ථාපිත අංශය සම්බන්ධයෙන්, එය නියමිත දිනට 52% ක් වූ අතර, නියමිත දිනෙන් එක් මාසයක් තුළ එය 58% ක් විය. නියමිත දිනෙන් මාස දෙකක් තුළ අනුකූලතා අනුප්‍රමාණය මෙම අංශයෙහි 62% ක් විය.

සියලු බදු වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය ස්ව තක්සේරු බදු ක්‍රමයක අපේක්ෂිත මට්ටම් නොවුන ද, බොහෝ දුරට අනුකූල වී ඇත.

කෙසේ වෙතත්, වාර්තා අනුකූලතාවය සාක්ෂාත් කර ගැනීමෙහි ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අවශ්‍ය ක්‍රියාමාර්ග නොකඩවා සිදු කරනු ලබයි.

07 වන වගුවෙන් 2010/2011 සිට 2014/2015 වසර දක්වා නියමිත දිනට සහ නියමිත දින සිට එක් මසක් තුළ ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය පෙන්වයි. අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතා අනුප්‍රමාණයන් 08 වන වගුවෙන් පෙන්වයි.

.වගුව 07 - ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතාවය 2010/2011 සිට 2014/2015 දක්වා

| තක්සේරු වර්ෂය | අංශය | නියමිත දිනට අනුකූලතාවය | නියමිත දින සිට මාසයක් තුළ අනුකූලතාවය |
|---|---|---|---|
| 2010/2011 | සංස්ථාපිත | 56% | 68% |
| | සංස්ථාපිත නොවන | 42% | 59% |
| 2011/2012 | සංස්ථාපිත | 56% | 60% |
| | සංස්ථාපිත නොවන | 39% | 48% |
| 2012/2013 | සංස්ථාපිත | 56% | 70% |
| | සංස්ථාපිත නොවන | 41% | 54% |
| 2013/2014 | සංස්ථාපිත | 53% | 61% |
| | සංස්ථාපිත නොවන | 42% | 57% |
| 2014/2015 | සංස්ථාපිත | 52% | 58% |
| | සංස්ථාපිත නොවන | 47% | 62% |

වගුව 08 - අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතාවය

| වර්ෂය | එකතු කළ අගය මත බදු | ආර්ථික සේවා ගාස්තු | ජාතිය ගොඩනැගීමේ බදු | උපයන විට ගෙවීමේ බදු | |
|---|---|---|---|---|---|
| වසර 2013 | 78% | 93% | 77% | තක්සේරු වර්ෂ 2012/13 | 53% |
| වසර 2014 | 49% | 71% | 84% | තක්සේරු වර්ෂ 2013/14 | 55% |
| වසර 2015 | 65% | 68% | 86% | තක්සේරු වර්ෂ 2014/15 | 63% |

## 2.9 ආදායම් බදු රැස්කිරීම

ආදායම් බද්දෙන් ආදායම් උත්පාදනය; සුපිරි වාසි බද්ද ඇතුළත්ව සංස්ථාපිත ආදායම් බද්ද, පුද්ගල (තනි පුද්ගල) ආදායම් බද්ද, ලාභාංශ බදු සහ පොළිය මත රඳවාගැනීමේ බදු ඇතුළුව සමස්ත ආදායම 2015 වසරේ දී රුපියල් මිලියන 256,435 දක්වා ඉහළ ගියේ ය. මෙය 2014 වර්ෂයේ රැස්කරන ලද රුපියල් මිලියන 191,960 හා සසඳා බලන කල 25.14% ක ඉහළ යාමකි. මුළු ආදායම් බදු රැස්කිරීම වසර සඳහා රු. මිලියන 246,100 ඇස්තමේන්තුවට වඩා රු. මිලියන 10,435 ක අතිරික්තයක් පෙන්වයි. එය වසර සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමස්ත ආදායමෙන් 45.76% ක් වන අතර, එය 2014 වසරේ දී 37.33% ක් විය.

### 2.9.1 ආදායම් බදු රැස්කිරීම - අංශීය වශයෙන් පැහැදිලි කිරීම

මුළු ආදායම් බදු රැස්කිරීම (රුපියල් මිලියන 256,435) සඳහා සංස්ථාපිත අංශයෙන් ලද දායකත්වය රුපියල් මිලියන 155,871 ක් හෙවත් එකතු කරන ලද මුළු බදු ප්‍රමාණයෙන් 61% ක් විය. සංස්ථාපිත නොවන අංශයේ දායකත්වය රුපියල් මිලියන 100,564 ක් හෙවත් 39% කි. 2015 වසරේ දී සංස්ථාපිත අංශයෙන් ආදායම් බදු රැස්කිරීම පෙර වසරට වඩා රුපියල් මිලියන 63,843 ක් හෙවත් 69.37% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ රුපියල් මිලියන 49 ක් වූ සුපිරි වාසි බද්ද ය. සුපිරි වාසි බද්ද, එක් වරක් පමණක් ගෙවන බද්දක් ලෙස 2015 වසරේ අතුරු අයවැය මගින් හඳුන්වා දෙන ලදි. 2013/2014 තක්සේරු වර්ෂයේ ආදායම් බදු ගෙවීමට පෙර ලාභය, රුපියල් මිලියන දෙදහසක් ඉක්මවන්නා වූ යම් සමාගමක් හෝ පුද්ගලයෙක් සහ 2013/2014 තක්සේරු වර්ෂයේ පාලිත සහ පාලක සමාගම්වල ආදායම් බදු ගෙවීමට පෙර ලාභවල එකතුව රුපියල් මිලියන දෙදහසක් ඉක්මවන සමාගම් සමූහයක සෑම සමාගමක් මතම මෙම බද්ද පනවන ලදි.

අංක 9 වගුව මගින් එහි සංයුතිය පෙන්වන අතර 05 වන සටහනෙන් එය නිරූපණය කෙරේ.


**වගුව 09 - සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස්කිරීම් 2014 සහ 2015**

| | 2015 | | 2014 | |
|---|---|---|---|---|
| | බදු රැස් කිරීම (රු.) | % | බදු රැස් කිරීම (රු.) | % |
| සංස්ථාපිත* | 155,870,960,759 | 61% | 92,028,323,420 | 48% |
| සංස්ථාපිත නොවන** | 100,563,979,780 | 39% | 99,931,727,250 | 52% |
| **එකතුව** | **256,434,940,539** | **100%** | **191,960,050,670** | **100%** |

* 2014 වසරේ රු. මිලියන 10,365 ක සහ 2015 වසරේ රු. මිලියන 12,340 ක ලාභාංශ බදු ඇතුළත්ය.

** පොළී ආදායමෙන් සංස්ථාපිත අංශය විසින් ඉවු කරන ලද සේවාවන්ගෙන් අඩු කරන ලදුව, ප්‍රේෂණය කරන ලද රඳවුම් (WHT) බදු සහ උපයන විට ගෙවීමේ (PAYE) ක්‍රමය යටතේ සේවා නියුක්තීන් විසින් ගෙවන ලද ආදායම් බදු ඇතුළත් වේ.

**සටහන 05**
**සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස්කිරීම් 2014 සහ 2015**




### 2.9.2 ආදායම් බදු රැස්කිරීමේ ප්‍රභවමය වශයෙන් විශ්ලේෂණය

වසර තුළ රැස්කරන ලද ආදායම් බදුවල ප්‍රභවමය වශයෙන් සංයුතිය (සේවා නියුක්ත සහ වෙනත්) අංක 10 දරන වගුවෙන් පෙන්නුම් කරයි.

| වගුව 10 - ආදායම් බදු රැස්කිරීම - 2015 | | |
|---|---|---|
| ප්‍රභවය | බදු රැස් කිරීම (රු. මිලියන) | |
| **සේවා නියුක්තිය** | | |
| උ.වි.ගෙ. ක්‍රමය | 26,019.87 | |
| පැහැර හරින ලද බදු සමඟ දණ්ඩන තක්සේරු කිරීම් | 211.45 | **26,231.32** |
| **වෙනත්** | | |
| ස්වයං තක්සේරු සහ දණ්ඩන සමඟ තක්සේරු කිරීම් | 150,887.98 | |
| පොළී මත රඳවාගැනීමේ බදු, කුලී සහ නියමිත ගාස්තු | 62,911.84 | |
| ප්‍රභවයේ දී වෙනත් අඩු කිරීම් | 16,475.49 | |
| **දළ බදු රැස් කිරිම** | | **256,506.63** |
| අඩු කළා: ආපසු ගෙවීම් | | -71.69 |
| **ශුද්ධ රැස් කිරීම්** | | **256,434.94** |

රඳවාගැනීමේ බදු යාන්ත්‍රණය යටතට නොගැනෙන වෙළෙඳාම, ව්‍යාපාර, වෘත්තීය, රැකියාව සහ වෙනත් සේවා මත බදු ඇතුළුව ස්වයං තක්සේරු හා දණ්ඩන සමඟ තක්සේරු ආකාරයෙන් රැස්කිරීම් එකතුව රුපියල් මිලියන 150,888/- ක් වේ.

### 2.9.3 ආදායම් බද්දට අදාළව ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්

සමාලෝචනයට බඳුන් කරන වර්ෂය තුළ අයවැය මගින් ප්‍රකාශිත පරිදි බදුකරණ යෝජනා සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම පිණිස දේශීය ආදායම් පනතට පහත සඳහන් වෙනස්කම් සිදුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

**බදු නිදහස් කිරීම්**

i. අමෙරිකා එක්සත් ජනපද ඩොලර් තැන්පතු හෝ යම් විදේශ කොටස් හුවමාරුවක ලැයිස්තුගත අමෙරිකා එක්සත් ජනපද ඩොලර් නාමික සුරැකුම්පත් හි 2015 ජනවාරි මස 1 වැනි දින හෝ එදිනට පසුව කරන ලද ආයෝජන වලින් යම් භාරයකට උද්ගතවන හෝ උපචිතවන ලාභ සහ ආදායම.

ii. (IT/BPO) තොරතුරු තාක්ෂණ හෝ ව්‍යාපාර ක්‍රියාවලි බැහැරදීමේ සමාගමක් ආරම්භ කිරීමෙන් වසර 2 ක කාලසීමාවක් සඳහා එම IT/BP සමාගමේ සුවිශේෂී අවශ්‍යතාවයක් මත රාජ්‍යභාග ආකාරයෙන් කරන ලද යම් ගෙවීමකින් ශ්‍රී ලංකාවෙන් බැහැරව යම් සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට උද්ගතවන හෝ උපචිත වන ලාභ හෝ ආදායම.

iii. නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද යම් සංස්ථාපිත ණය සුරැකුම් පතක 2015 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව කරන ලද යම් ආයෝජනයකින් යම් තැනැත්තෙකුට උපචිත වන හෝ උද්ගතවන පොළිය හෝ වට්ටම.

**සහනදායී අනුප්‍රමාණයන්**

i. 1970 කාලවකවානුවේ නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භකර ආනයනය සමඟ තරඟකාරිත්වය පවත්වාගෙන ගොස් සිටින යම් දේශීය නිෂ්පාදකයෙකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද එම නිෂ්පාදිත භාණ්ඩ දේශීය වෙළෙඳපොළේ දී විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම මත 10% ක අඩු කිරීමක්.

ii. නිශ්චිත සේවානියුක්ති වෘත්තිකයින් වර්ගීකරණයන් සඳහා අදාළ 16% සහනදායී උපරිම බදු අනුප්‍රමාණය අනෙකුත් සේවානියුක්ත වර්ගීකරණයන් ආවරණය කිරීම සඳහා ව්‍යාප්ත කරන ලදි.

iii. කෘෂිකාර්මික අංශය සඳහා අදාළ 12% සහනදායී බදු අනුප්‍රමාණය දේශීය සීනි කර්මාන්තයට ද ව්‍යාප්ත කරන ලදි.

iv. 59 (ආ) වන වගන්තියෙහි සඳහන් වාර්ෂික පිරිවැටුමේ සීමාව වන රු. මිලියන 500, රු.මිලියන 750 දක්වා වැඩි කරන ලදි.

v. ජාත්‍යන්තර චිත්‍රපට/නාට්‍ය උළෙලක දී සම්මානලාභී චිත්‍රපටයක් හෝ නාට්‍යයක් නිපදවන පුද්ගලයෙකුගේ චිත්‍රපට/නාට්‍ය නිෂ්පාදනයෙන් ලැබෙන ලාභ සහ ආදායමෙන් අඩක් අදාළ සම්මානය ලැබූ වසරේ සිට වසර 5 ක් දක්වා බද්දෙන් නිදහස් කරන ලදි.

**නව ආයෝජන සඳහා බදු සහන**

i. දේශීය ආදායම් පනතේ 17 අ වගන්තිය යටතේ 2014.04.01 දිනට පෙර අනුමත කර ඇති නමුත් 2015.04.01 දිනට පෙර ආයෝජන කටයුතු සම්පූර්ණ කළ නොහැකි වූ හෝ 2016.04.01 දිනට පෙර වාණිජ කටයුතු ආරම්භ කළ නොහැකි වූ යම් නව ව්‍යවසායක් සඳහා ආයෝජන සම්පූර්ණ

කිරීමට සහ වාණිජ කටයුතු ආරම්භ කිරීමට දී ඇති කාලය 2017.04.01 දින දක්වා දීර්ඝ කරන ලදී.

ii. ඇමෙරිකානු ඩොලර් මිලියන 2 කට නො අඩු ආයෝජනයක් සහිත අපනයන සඳහා භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටින ව්‍යවසායක් වන යම් නව ව්‍යවසායක් සඳහා 25 වන වගන්තියේ විධිවිධාන යටතේ ක්ෂය දීමනා හිමි යම් ස්ථාවර වත්කම් අත්කර ගැනීම මත ක්ෂය දීමනා එකවර අඩු කිරීමට ඉඩ ලබාදෙන ලද අතර එම ලාභයෙන් බෙදා හරිනු ලබන ලාභාංශ මත හෝ බෙදා හැරිය හැකි ලාභයෙන් ගෙවූ ලෙස සලකනු ලබන ලාභාංශ මත බද්දෙන් වාණිජ කටයුතු ආරම්භයේ සිට වසර 5 ක් දක්වා එම නව ව්‍යවසාය නිදහස් කරන ලදී.

iii. භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටින (මත්පැන් හෝ දුම්කොළ හැර) යම් ව්‍යාපාරයක් සියයට 28 අනුප්‍රමාණයකට ආදායම් බද්දට යටත් වන්නේ නම් සහ 2015.04.01 දිනට පසු නමුත් 2017.04.01 දිනට පෙර 25 වන වගන්තිය යටතේ ක්ෂය දීමනා හිමි ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම සඳහා රු. මිලියන 300 කට නොඅඩු ආයෝජනයක් සිදු කරමින් සිය ව්‍යාපාරය බස්නාහිර පළාත හැර වෙනත් පළාතකට ව්‍යාප්ත කරන්නේ නම් වසර පහක කාලසීමාවක් සඳහා එම ව්‍යාපාරයේ ලාභ සහ ආදායම් මත බදු අනුප්‍රමාණය සියයට 50 කින් නමුත් රු. මිලියන 500 ක් නොඉක්මවන ප්‍රමාණයකට අඩු කරන ලදී.

iv. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද කාලපරිච්ඡේදයක් තුළ යම් නිෂ්පාදන ව්‍යාපාරයක (මත්පැන් හෝ දුම්කොළ හැර ) රු. මිලියන 500 ක් ඉක්මවන කැපවුණු ආයෝජනයක් සහිතව 2015 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර බදු කාර්යය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වන යම් සමාගමක් වාණිජ කටයුතු ආරම්භයේ සිට වසර 7 ක් දක්වා අදාළ බදු අනුප්‍රමාණයෙන් සියයට 50 ක අඩු කිරීමක් සඳහා හිමිකම් ලබාදෙන ලදී.

**වියදම් අඩු කිරීම**

තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) යටතේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තෙකු විසින් පුහුණුවන්නන් සඳහා පිළිගත හැකි ප්‍රවර්ධන පුහුණු (උදා: NVQ Level) ලබාදීම සඳහා දරන ලද යම් වියදමක් වෙනුවෙන් එම වියදම මෙන් සියයට තුන්සියයකට සමාන මුදලක් අඩු කිරීමට ඉඩ ලබාදෙන ලදී.

**තැන්පතු පොළී ආදායම මත රඳවාගැනීමේ බදු**

i. පුද්ගලයින් සහ පුණ්‍යායතන සඳහා අදාළ වන තැන්පතු පොළී මත රඳවාගැනීමේ බදු ක්‍රමය සියයට 2.5 ක තනි රඳවාගැනීමේ බදු අනුප්‍රමාණයක් හඳුන්වා දෙමින් සංශෝධනය කරන ලදී.

ii. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා අදාළ වන පොළී මත ආදායම් බදු නිදහස වර්තමානයේ අදාළ වන බදු නිදහස් සීමාව ඉවත් කරමින් පුළුල් කරන ලදී.


## 2.10 එකතු කළ අගය මත බදු රැස්කිරීම.

අදාළ වර්ෂය තුළ දී එකතු කළ අගය මත බදු (VAT) රැස්කිරීම රුපියල් මිලියන 214,237 ක් වූ අතර, එය වසර සඳහා ඇස්තමේන්තුගත රුපියල් මිලියන 230,000 ට වඩා රුපියල් මිලියන 15,763 ක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම අගය කලින් වසරට වඩා රුපියල් මිලියන 23,678 ක හෙවත් 11.05% ක අඩුවීමකි. කෙසේ වෙතත්, මූල්‍ය සේවා සහ වෙනත් සේවා මත රැස්කරන ලද මුළු එකතු තළ අගය මත බදු කලින් වසරට වඩා වැඩිවීමක් පෙන්නුම් කෙරේ. අදාළ වර්ෂය තුළ මූල්‍ය සේවා සහ වෙනත් සේවා මත රැස්කරන ලද මුළු එකතු කළ අගය මත බදු ප්‍රමාණය රු. මිලියන 101,616 ක් වූ අතර මෙම අගය 2014 වර්ෂයට වඩා රු. මිලියන 11,423 ක වැඩිවීමකි. 2014 දී එය රුපියල් මිලියන 90,193 ක් විය. මෙම අඩුවීමට හේතුව වර්ෂයකට රු. මිලියන 12 සිට වර්ෂයකට රු. මිලියන 15 දක්වා බද්දට යටත් සීමාව පුළුල් කිරීම මෙන්ම සියයට 12 සිට සියයට 11 දක්වා එකතු කළ අගය මත බදු අඩුකිරීම විය හැකිය.

එකතු කළ අගය මත ආංශික වශයෙන් දළ රැස්කිරීම්, ආපසු ගෙවීම් සහ ශුද්ධ රැස්කිරීම 11 වන වගුවෙන් පෙන්වන අතර, එය 06 වන සටහනෙන් නිරූපණය කෙරේ.

**වගුව 11- එකතු කළ අගය මත බදු දළ රැස් කිරීම් සහ ආපසු ගෙවීම්**

| අංශය | 2014 | | 2015 | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | | දළ රැස් කිරීම් (රු. මිලියන) | | ආපසු ගෙවීම් | ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | |
| **නිෂ්පාදන අංශය** | | 45,441.70 | | 29,627.17 | 732.65 | | 28,894.52 |
| **නිෂ්පාදන නොවන අංශය** | | | | | | | |
| - සේවාව | 65,752.67 | | 73,916.97 | | 197.46 | 73,719.51 | |
| - මූල්‍ය සේවාව | 24,436.89 | | 27,896.35 | | | 27,896.35 | |
| - වෛකල්පිත එ.අ.බ. | 3.49 | 90,193.05 | 0.17 | 101,813.49 | | 0.17 | 101,616.03 |
| **ආනයන** | | 102,280.68 | | 83,727.80 | 1.37 | | 83,726.43 |
| **එකතුව** | | **237,915.43** | | **215,168.46** | **931.48** | | **214,236.98** |




**වගුව 12 - දළ ජාතික නිෂ්පාදනයට එකතු කළ අගය මත බදු දායකත්වය ආංශික විශ්ලේෂණය**

| අංශය | 2014 | | 2015 | | දළ ජාතික නිෂ්පාදනයට එ.අ.බ.රැස්කිරීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | % | ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | % | 2014 | 2015 |
| **නිෂ්පාදන අංශය** | 45,441,698,904 | 19.10% | 28,894,521,159 | 13.49% | 0.46% | 0.26% |
| **නිෂ්පාදන නොවන අංශය** | 90,193,048,803 | 37.91% | 101,616,031,540 | 47.43% | 0.92% | 0.91% |
| **ආනයන** | 102,280,685,200 | 42.99% | 83,726,432,785 | 39.08% | 1.05% | 0.75% |
| **එකතුව** | **237,915,432,907** | **100.00%** | **214,236,985,484** | **100.00%** | **2.43%** | **1.92%** |

### 2.10.1 එකතු කළ අගය මත බදු කර්මාන්තය වශයෙන් දායකත්වය

13 වන වගුව මගින් බැංකු, රක්ෂණ, හෝටල් සහ ආපනශාලා, ඉදිකිරීම්, විදුලිය යනාදී වශයෙන් වර්ගීකරණය කරන ලද දේශීයව එකතු කළ අගය මත සමස්ත ආදායමට ලබා දී ඇති දායකත්වය පෙන්වයි.

| වගුව 13:- දළ දේශීය එකතු කළ අගය මත බද්ද - නිෂ්පාදන සහ සේවා | | | | | |
|---|---|---|---|---|---|
| අංශය | 2013 (රු. මිලියන) | 2014 (රු. මිලියන) | පසුගිය වසරට සාපේක්ෂව අඩුවීමේ/වැඩිවීමේ ප්‍රතිශතය (%) | 2015 (රු. මිලියන) | පසුගිය වසරට සාපේක්ෂව අඩුවීමේ/වැඩිවීමේ ප්‍රතිශතය (%) |
| බැංකු | 15,921 | 18,822 | 18.22% | 23,089 | 22.67% |
| රක්ෂණ | 4,882 | 4,910 | 0.57% | 5,403 | 10.04% |
| හෝටල් සහ ආපනශාලා | 5,672 | 6,507 | 14.72% | 7,429 | 14.17% |
| ඉදිකිරීම් | 5,293 | 6,943 | 31.17% | 6,605 | -4.87% |
| විදුලිය සහ ගෑස් | 502 | 560 | 11.55% | 501 | -10.54% |
| ආනයන | 9,113 | 10,389 | 14.00% | 9,880 | -4.90% |
| මූල්‍ය | 11,860 | 13,982 | 17.89% | 18,487 | 32.22% |
| සංනිවේදන | 256 | 394 | 53.91% | 376 | -4.57% |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 344 | 1,509 | 338.66% | 417 | -72.37% |
| පාන වර්ග - මද්‍යසාර | 9,747 | 9,930 | 1.88% | 396 | -96.01% |
| වර්ගීකරණය නොකළ සේවා | 7,916 | 9,866 | 24.63% | 12,295 | 24.62% |
| වර්ගීකරණය නොකළ නිෂ්පාදන | 9,517 | 10,280 | 8.02% | 9,173 | -10.77% |
| වෙනත් | 39,516 | 42,408 | 7.32% | 36,460 | -14.03% |
| **එකතුව** | **120,538** | **136,500** | **13.24%** | **130,511** | **-4.39%** |

### 2.10.2 එකතු කළ අගය මත බද්දට අදාළව සිදුකරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්

**බදු අනුප්‍රමාණය අඩුකිරීම**

අඩුකල එ.අ.බ. අනුප්‍රමාණය - 11%
(බදු බණ්ඩය II/III වේ.)

**එකතු කළ අගය මත බදු බැඳියාව සඳහා සීමාව පුළුල් කිරීම**

ලියාපදංචි වීම සඳහා බද්දට යටත් සීමාව 2015 ජනවාරි 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා රු.මිලියන 3 සිට රු. මිලියන 3.75 දක්වා තවදුරටත් පුළුල් කරනු ලැබේ.

**තොග සහ සිල්ලර වෙළෙඳාම මත එකතු කළ අගය මත බද්ද**

තොග සහ සිල්ලර වෙළෙඳාම පවත්වාගෙන යන යම් තැනැත්තෙකුගේ හෝ හවුල් ව්‍යාපාරයක යම් ලිත් වර්ෂයක අනුගාමී මාස තුනක් සඳහා සැපයුම් වටිනාකමෙහි බද්දට යටත් සීමාව 2015 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි රු. මිලියන 250 සිට රු. මිලියන 100 දක්වා අඩු කරනු ලැබේ.

**3 (1) වන වගන්තියේ (ඊ) ඡේදයෙහි කාර්යය සඳහා මුළු සැපයුම්**

යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන්, 3 (1) වන වගන්තියේ (ඊ) ඡේදයෙහි කාර්යය සඳහා යන්නෙන්:

මෙම පනතේ කාර්යයන් සඳහා එක් ලියාපදිංචි කිරීමක් හෝ එයට වැඩි ලියාපදිංචි කිරීම් යටතේ එක් ස්ථානයක හෝ එකිනෙකට වෙනස් ස්ථානයන් හි වෙනත් සමාන ස්වභාවයේ ව්‍යාපාර කරගෙන යන අතර සමාගමක යම් අධ්‍යක්ෂවරයෙකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෙකු එම අනෙක් ව්‍යාපාරයේ අධ්‍යක්ෂවරයෙකු හෝ හවුල්කරුවෙකු වන යම් ව්‍යාපාරයක් ඇතුළුව තොග හෝ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක නිරත යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක සැපයුම්හි මුළු වටිනාකම අදහස් වේ.

**එකතු කළ අගය මත බදු ලෙස සැලකෙන බදු සඳහා යටත්වීම පිණිස නිදහස් සැපයුමෙහි 25% නිශ්චය කරගැනීමෙහි ලා නව ඉවත් කිරීම්**

3 (1) වන වගන්තියේ (ඊ) ඡේදයේ සඳහන් ලියාපදිංචි තැනැත්තෙකු සම්බන්ධයෙන්, නිදහස් සැපයුම් හි 25% යම් අතිරික්තයක් බදු අයකළ යැයි සැලකෙන සැපයුම් ලෙස සැලකිය යුතු අතර සම්පූර්ණ පදනම මත එ.අ. බද්දට යටත් වේ.

නිදහස් සැපයුම් හි 25% සීමාව නිශ්චය කරගැනීමේ දී පහත සඳහන් සැපයුම් ඉවත් කරනු ලැබේ. (සැපයුම් ආනයනකරු විසින්ම කරනු ලබන විට විශේෂ වෙළෙඳ බද්දට යටත් ශුන්‍ය අනුප්‍රමාණික අයිතමයන් සහ භාණ්ඩ බැහැර කිරීමට අතිරේක වශයෙන්)

- දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද දියර කිරි (2015 ජනවාරි 1වන දින සිට බලපැවැත්වෙන පරිදි

- දේශීයව වගා කරන ලද පළතුරු සහ එළවළු හෝ දේශීයව නිෂ්පාදනය කරන ලද සහල් (2015 නොවැම්බර් 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි)

අදාළ වර්ෂය තුළ දී පහත සඳහන් නිදහස් කිරීම් එකතු කළ අගය මත බද්දට හඳුන්වා දී ඇත.

**නිදහස් කිරීම්**

(i) **ආනයනය කරන ලද සැපයුම්:**

i. අර්ධ ට්‍රේලර්ස් සඳහා කෘෂිකාර්මික ට්‍රැක්ටර් හෝ මාර්ග ට්‍රැක්ටර්

ii. ආනයනය කිරීම මත රේගු බද්දට සහ සෙස් බද්දට හෝ එම නිෂ්පාදන, නිෂ්පාදනය කිරීම මත සුරාබදු ආඥාපනත යටතේ නිෂ්පාදන බද්දට යටත් වන ආනයනය කරන ලද හෝ නිපදවන ලද සහ අතුරු නිෂ්පාදනයක් ලෙස සපයන "ඊතයිල් ඇල්කොහොල්" (මධ්‍යසාර) සැපයීම හෝ ආනයනය කිරීම.

**(ii) සැපයුම්**

i. ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් නොවන යම් වත්කමක් මත යම් මූල්‍ය කල්බදු ගිවිසුමක් හෝ මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ, 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පෙර එළඹි යම් ගිවිසුමක ප්‍රති ලේඛනගත කිරීම සඳහා ගිවිසුමක් නොවන, එම ගිවිසුම 2014 ඔක්තෝබර් මස 25 වන දින හෝ එදිනට පසුව එළඹෙන ලද්දේ නම් කල්බදු පහසුකම් සඳහා ප්‍රතිපාදන සැපයීම.

ii. ආනයනය කරන ලද:

(අ) සැකසුම් නොකරන ලද දැව කඳන්, නැව් හෝ වේවැල්; හෝ

(ආ) 2007 අංක 48 දරන විශේෂ භාණ්ඩ බදු පනත යටතේ විකිණීම සඳහා අනුවර්තනය කිරීම හැර යම් සැකසුම් කිරීමකින් තොරව එකී භාණ්ඩ විකුණනු ලබන බවට කොන්දේසියට යටත්ව විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යටත් යම් භාණ්ඩයක්.

iii. 2011 අංක 21 දරන විදුලි සංදේශ ගාස්තු පනත යටතේ විදුලි සංදේශ ගාස්තුවට යටත් විදුලි සංදේශ සේවාවන් සහ එම පනතේ "විදුලි සංදේශ සේවා" යන ප්‍රකාශනයෙහි අර්ථ නිරූපණයෙහි එම බැඳියාවෙන් විශේෂයෙන් ඉවත් කරන ලද සේවාවන් (2014 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වේ.)

iv. දේශීයව නිෂ්පාදනය කරන ලද පොල් කිරි (2015 නොවැම්බර් 1 වන දින සිට ක්‍රියාත්මක වේ.)

III. **ආනයනය කිරීම:**

i. රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරන ලද පරිදි එම නියමයන් සහ කොන්දේසිවලට යටත්ව;

(අ) 2015 ජනවාරි 1 වන දිනට පෙර කරන ලද එම ආනයන මත රුපියල් විසිපන්දහසකට; සහ

(ආ) 2015 ජනවාරි 1 වන දින හෝ එදිනට පසුව යම් කාලපරිච්ඡේදයක් සඳහා එම ආනයන මත රුපියල් පනස්දහසකට නොවැඩි වටිනාකම සහිත ව්‍යාපාරයකට අදාළව සාම්පල ආනයනය කිරීම.

ii. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින්, විශේෂිත වරායන් තුළ භාවිත කිරීම සඳහා යන්ත්‍රසූත්‍ර, උපකරණ හෝ අමතර කොටස් ආනයනය කිරීම.

## 2.11 ජාතිය ගොඩනැගීමේ බදු (NBT) රැස්කිරීම

අදාළ වර්ෂය තුළ මුළු ආදායමට ලබාදෙන ලද ජා.ගො. බදු දායකත්වය රු. මිලියන 67,911 ක් විය. මෙය 2014 වසරේ වූ රු. මිලියන 65,354 හා සසඳා බලන කළ සුළු වැඩිවීමකි. මුළු ජා.ගො.බදු ආදායමෙන් රු. මිලියන 23,972 ක් පළාත් සභා වෙත මාරු කරන ලදි.


**වගුව 14 - ආංශික වශයෙන් ජා.ගො.බදු රැස්කිරීම - 2014**

| අංශය | ශුද්ධ රැස් කිරීම් (රු.) | |
|---|---|---|
| | **2014** | **2015** |
| නිෂ්පාදන | 15,354,329,424 | 10,163,343,792 |
| සේවා | 26,238,065,267 | 31,256,204,685 |
| ආනයන | 23,764,587,831 | 26,491,513,723 |
| **එකතුව** | **65,356,982,522** | **67,911,064,215** |

15 වන වගුව මඟින් ජාතිය ගොඩනැගීමේ ආදායම් ඇස්තමේන්තුව ආදායම පිළිවෙලින් 2014 වසරේ සහ 2015 වසරේ රුස්කරන ලද ආදායම (පළාත් සභා වෙත මාරු කිරීමෙන් පසුව) සමඟ සැසඳීම දක්වා ඇත.

වගුව 15 - ඇස්තමේන්තු සමඟ ජාතිය ගොඩනැගීමේ බදු රැස් කිරීම

| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | ආදායම් රැස්කිරීම (රු.) | % |
|---|---|---|---|
| 2015 | 48,000,000,000 | 43,938,771,964 | 92% |
| 2014 | 45,600,000,000 | 44,583,121,715 | 98% |




### 2.11.1 ජාතිය ගොඩනැගීමේ බද්දට අදාළව සිදුකරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්:

**ජා.ගො.බද්දට යටත්වීම සඳහා බදු නිදහස් සීමාව පුළුල් කිරීම**

ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් කාර්තුමය පිරිවැටුම 2015 ජනවාරි 1 දින හෝ එදිනට පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා රු. මිලියන 3 සිට රු. මිලියන 3.75 දක්වා තවදුරටත් ව්‍යාප්ත කරන ලදි.

**ව්‍යතිරික්ත භාණ්ඩ**

(i) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කර ඇති පරිදි නියමයන් හා කොන්දේසිවලට යටත්ව;

(අ) එම සාම්පල 2015 ජනවාරි 1 වන දිනට පෙර ආනයනය කරනු ලැබූ විට රුපියල් විසිපන්දහසක්; සහ

(ආ) එම සාම්පල 2015 ජනවාරි 1 වන දින හෝ එදිනට පසුව ආනයනය කරනු ලැබූ විට රුපියල් පනස් දහසකට නොවැඩි වටිනාකමක් ඇති ව්‍යාපාරයකට අදාළව සාම්පල ආනයනය කිරීම.

(ii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් විශේෂිත වරායන් තුළ භාවිත කිරීම සඳහාම යන්ත්‍රසූත්‍ර, උපකරණ හෝ අමතර කොටස්;

(iii) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ හඳුනාගනු ලැබුවා වූ ද, ආනයනය කිරීමේ දී 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු ගෙවීමට යටත් වන්නා වූ හෝ නිෂ්පාදනය කිරීමේ දී ඉහත කී බද්දට යටත් වන්නා වූ ද, 2014 ඔක්තෝබර් මස 25 වන දිනය වන විට විකුණා නොමැතිව පැවතියා වූ තොගද ඇතුළුව පසුව නිෂ්පාදනය කරන ලද්දේ නම් නිෂ්පාදනය කිරීමේ දී ඉහත කී බද්දට ම යටත් විය හැකිව තිබුණා වූ ද මෝටර් වාහනයක් ද ඇතුළුව, මෝටර් වාහනයක්;

(iv) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ හඳුනාගනු ලැබුවා වූ ද, අවස්ථාවෝචිත පරිදි ආනයනය කිරීමේ දී හෝ සිගරට් නිෂ්පාදනය කිරීම මත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු ගෙවීමට 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ සෙස් බදු ගෙවීමට යටත් වන්නා වූ ද, 2014 ඔක්තෝබර් මස 25 වන දිනයට පසුව සිගරට් නිෂ්පාදනය කරනු ලැබුවේ නම්, එම නිෂ්පාදනය මත ඉහත කී බද්දට ම යටත් විය හැකිව තිබුණා වූ ද, 2014 ඔක්තෝබර් මස 25 වන දිනය වන විට විකුණා නොමැතිව පැවතියා වූ ද, නිෂ්පාදනය කරන ලද සිගරට් තොග ද ඇතුළුව, සිගරට්;

(v) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ හඳුනාගනු ලැබුවා වූ ද, අවස්ථාවෝචිත පරිදි, ආනයනය කිරීමේ දී 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත යටතේ රේගු බදු ගෙවීමට සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ සෙස් බදු ගෙවීමට යටත් වන්නා වූ හෝ නිෂ්පාදනය කිරීමේ දී (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත යටතේ සුරාබදු ගෙවීමට යටත් වන්නා වූ හා 2014 ඔක්තෝබර් මස 25 වන දිනයට පසුව නිෂ්පාදනය කරනු ලැබුවේ නම්, ඉහත කී

බද්දට ම යටත් විය හැකිව තිබුණා වූ හා 2014 ඔක්තෝබර් මස 25 වන දිනය වන විට විකුණා නොමැතිව පැවතියා වූ මත්පැන් තොග ද ඇතුළුව, මත්පැන්;

**ව්‍යතිරික්ත සේවා**

i. වංචල දේපළ බදු දීම

ii. විදුලි සංදේශ සේවා


iii. වාසික පහසුකම් සැපයීමට අදාළව ඉදිකරන ව්‍යාපෘතියේ අගය අමෙරිකානු ඩොලර් මිලියන 10 කට අඩු හෝ වෙනත් යම් ව්‍යවහර මුදලකට සමාන වන තාක් ඉදිකරමින් පවතින හෝ වාසික පහසුකම් විකුණන නිශ්චල දේපළ සහ එහි වැඩිදියුණු කිරීමේ ව්‍යාපාරික කටයුතු.

## 2.12 ආර්ථික සේවා ගාස්තු (ESC) රැස්කිරීම

අදාළ වර්ෂය තුළ සමස්ත ආ.සේ.ගා. රු. මිලියන 6,148 ක් වූ අතර එමඟින් සමස්ත ආදායමට වූ දායකත්වය සියයට 1.10 කි. එය වසර සඳහා ඇස්තමේන්තුවෙන් සියයට 95 කි.

| වගුව 16 ආර්ථික සේවා ගාස්තු රැස්කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම රු. | ආදායම් රැස්කිරීම රු. | % |
| 2015 | 6,500,000,000 | 6,148,447,689 | 95% |
| 2014 | 8,400,000,000 | 6,154,508,746 | 73% |

සටහන 08
ආර්ථික සේවා ගාස්තු රැස්කිරීම
2015




## 2.13 උපයන විට ගෙවීමේ බදු (PAYE) රැස්කිරීම

සේවා නියුක්ත ආදායම මත ආදායම් බද්දේ කොටස උ.වි.ගෙ. (PAYE) ක්‍රමය යටතේ වසර තුළ රැස්කරන ලද දළ ආදායම 2014 වසරේ වූ රු.මිලියන 22,297 ට සාපේක්ෂව රු.මිලියන 26,206 ක් විය.

| වගුව 17 - උපයන විට ගෙවීමේ බදු සහ ආදායම් මට්ටම් විශ්ලේෂණය කිරීම | | | | |
|---|---|---|---|---|
| ආදායම් පරාසය (රුපියල්) | | සමස්ත දළ පාරිශ්‍රමිකය (රුපියල්). | සේවා නියුක්තිකයින් සංඛ්‍යාව | උ.වි.ගෙ. යටතේ ගෙවන ලද බදු (රුපියල්). |
| 600,000 ට අඩු | බදු අඩු නොකළ | 278,639,706,728 | 1,179,759 | |
| | බදු අඩු කළ | 81,802,331,128 | 133,149 | 942,793,330 |
| 600,001-1,100,000 | | 129,737,471,313 | 161,488 | 1,321,674,263 |
| 1,100,001-1,600,000 | | 82,583,656,105 | 74,353 | 2,331,761,381 |
| 1,600,001-2,100,000 | | 43,827,545,985 | 25,094 | 2,179,786,834 |
| 2,100,001-2,600,000 | | 23,408,354,398 | 11,062 | 1,534,690,181 |
| 2,600,001-3,600,000 | | 21,416,665,961 | 7,374 | 2,023,828,753 |
| 3,600,000 ට වැඩි | | 64,797,318,860 | 8,816 | 10,937,448,673 |
| | | 8,390,294,354 | 5,160 | 1,245,948,422 |
| **එකතුව** | | **734,603,344,831** | **1,606,255** | **22,517,931,837** |

*සටහන: 2014/2015 තක්සේරු වර්ෂය මත පදනම්ව සේවා යෝජකයින් විසින් ඉදිරිපත් කළ සම්පූර්ණ කරන ලද වාර්තාවලට අනුව ඉහත තොරතුරු සපයා ඇත.*

## 2.14 රඳවා ගැනීමේ බදු (WHT) (පොළිය සහ නිශ්චිත ගාස්තු මත)

පොළිය මත රඳවා ගැනීමේ බදු රැස්කිරීම වසර තුළ දී රුපියල් 62,411,593,160/- ක් වූ අතර, එය රජයේ සුරකුම්පත් වලින් රු.53,397,715,864/- කින් (2014 වසරේ දී රු.62,704,548,497) ක් සහ ඉතිරිය අනෙකුත් සාධන පත්‍රයන්ගෙන් ද ලැබුණි. පොළිය මත රඳවාගැනීමේ මඟින් උපයාගන්නා ලද

ආදායම පෙර වසරට වඩා රුපියල් මිලියන 6,990 කින් අඩු විය.

රු. 492,472,221/- ක අගයක් නිශ්චිත ගාස්තු මත රඳවුම් බදු වශයෙන් රැස්කර ගන්නා ලදී. (2014 වසරේ දී රු.214,338,440/-).


## 2.15 ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම

වසර තුළ ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම රු.831,922,843 ක් විය. වසර සඳහා ඇස්තමේන්තුගත අගය හා සසඳා බලන කළ මෙමගින් රු.1,368,077,157/- ක පහළයාමක් පිළිඹිබු වේ.

18 වන වගුව මඟින් ඔට්ටු සහ සූදු බදු ඇස්තමේන්තුගත ආදායම 2014 සහ 2015 වසරවල රැස්කරන ලද ආදායම සමඟ සැසඳීම දක්වා ඇත.

**වගුව 18 - ඔට්ටු හා සූදු බදු රැස් කිරීම**

| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | ආදායම රැස් කිරීම (රු.) | % |
|---|---|---|---|
| 2015 | 2,200,000,000 | 831,922,843 | 38% |
| 2014 | 1,500,000,000 | 815,175,141 | 54% |




## 2.16 ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු රැස්කිරීම

2015 වසර තුළ ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු ආදායම රැස්කිරීම රු.753,314,770 ක් විය. මෙම බද්ද ගෙවීම සඳහා ලියාපදිංචි මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව 334 ක් විය.

19 වන වගුව මඟින් ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් ආදායම් ඇස්තමේන්තුව පිළිවෙලින් 2014 වසරේ සහ 2015 වසරේ රැස්කරන ලද ආදායම සමඟ සැසඳීම දක්වා ඇත.

**වගුව 19 - ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු ආදායම ඇස්තමේන්තු ද සමඟ**

| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | ආදායම රැස් කිරීම (රු.) | % |
|---|---|---|---|
| 2015 | 1,200,000,000 | 753,314,770 | 63% |
| 2014 | 1,000,000,000 | 841,828,584 | 84% |

## 2.17 මුද්දර බදු රැස්කිරීම

මුද්දර බදු ලෙස රුපියල් මිලියන 7,918 ක් වර්ෂය තුළ දී උත්පාදනය විය. 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර බදු මාරුකිරීම) පනත ප්‍රකාරව, මුද්දර බදු රැස්කිරීම් සම්පූර්ණ ප්‍රමාණය පළාත් සභාවලට මාරුකරන ලදි. මුද්දර බදු පදනම ඉහළ නැංවීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් උපදේශන හා අධීක්ෂන හමු පවත්වන ලද අතර, ඒ අනුව 2015 වසර තුළ ස්ථාන 95 ක් නිරීක්ෂණයට බඳුන් විය. සමථායන නියෝජිතයින් 8,393 ක් (2015.09.30 දිනට) මුද්දර බදු සඳහා විධිමත්ව ලියාපදිංචි වී තිබූ අතර, ඒ අතුරින් 8,227 දෙනෙකු උපලේඛන ඉදිරිපත් කොට තිබුනේ 100% අනුකූලතාවයක් වාර්තා කරමිනි.

## 2.18 ඉඩම් පැවරීම මත බදු

2013 බදු යෝජනා යටතේ ක්‍රියාත්මක කරන ලද ඉඩම් බද්දෙන් වසර සඳහා රැස්කිරීම රුපියල් මිලියන 1,607 ක් වූ අතර, එය වසර සඳහා ඇස්තමේන්තුගත අගයෙන් 142.22% කි.

## 2.19 දේශීය ආදායම් රැස්කිරීම 2011 සිට 2015 දක්වා (බදු වශයෙන්)


2011 වසරේ සිට 2015 දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම රැස්කිරීම් බදු වර්ග අනුව 20 වන වගුවේ සඳහන් දත්ත මඟින් නිරූපණය කෙරේ. අදාළ බදුවලින් ආදායම වැඩිවීම් සහ අඩුවීම් සහ ඒවා සඳහා පාදක විය හැකි හේතුන් සමඟ මෙම පරිච්ඡේදයේ මීට කළින් ඡේදයේ දී සැලකිල්ලට බඳුන් කරන ලදි.

## වගුව 20 – 2011 සිට 2015 දක්වා දේශීය ආදායම් රැස් කිරීම් - බදු වර්ග අනුව විශ්ලේෂණය

| බදු වර්ගය | 2011 | | 2012 | | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රැස් කිරීම් (රු.මි.) | % | රැස් කිරීම් (රු.මි.) | % | රැස් කිරීම් (රු.මි.) | % | රැස් කිරීම් (රු.මි.) | % | රැස් කිරීම් (රු.මි.) | % |
| ආදායම් බද්ද | 135,974 | 30.64 | 157,729 | 35.57 | 199,070 | 40.42 | 191,960 | 37.33 | 256,435 | 47.56 |
| ආර්ථික සේවා ගාස්තු | 21,335 | 4.81 | 14,864 | 3.35 | 6,596 | 1.34 | 6,155 | 1.2 | 6,148 | 1.1 |
| එකතු කළ අගය මත බදු | 215,420 | 48.54 | 204,656 | 46.15 | 217,687 | 44.2 | 237,915 | 46.27 | 214,237 | 38.23 |
| හර බදු | 4,232 | 0.95 | - | - | - | - | - | - | - | - |
| ඔට්ටු හා සූදු බදු | 286 | 0.06 | 289 | 0.07 | 592 | 0.12 | 815 | 0.16 | 832 | 0.15 |
| කොටස් ගනුදෙනු බද්ද | 3,264 | 0.74 | 1,285 | 0.29 | 1,197 | 0.24 | 2,048 | 0.4 | 1,395 | 0.25 |
| පිරිවැටුම් බද්ද | 131 | 0.03 | 138 | 0.03 | 218 | 0.04 | 472 | 0.09 | 16 | 0 |
| මුද්දර බද්ද | 7,217 | 1.63 | 6,535 | 1.47 | 6,884 | 1.4 | 7,918 | 1.54 | 11,596 | 2.07 |
| භාණ්ඩ හා සේවා බද්ද | 25 | 0.01 | 12 | - | 16 | - | 3 | - | 0.88 | 0 |
| ජාතික ආරක්ෂක බද්ද | 15 | - | 4 | - | 2 | - | 14 | - | 12 | 0 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 1,106 | 0.25 | 710 | 0.16 | 751 | 0.15 | 842 | 0.16 | 753 | 0.13 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 53,501 | 12.05 | 57,106 | 12.88 | 59,397 | 12.06 | 65,354 | 12.71 | 67,911 | 12.12 |
| ඉඩම් බද්ද | - | - | - | - | 97 | 0.02 | 579 | 0.11 | 1,066 | 0.19 |
| සමාජ වගකීම් බද්ද | 1,324 | 0.3 | 127 | 0.03 | 32 | 0.01 | 85 | 0.02 | 20 | 0 |
| **රැස් කිරීම්වල එකතුව** | **443,830** | **100.00** | **443,455** | **100.00** | **492,539** | **100.00** | **514,160** | **100.00** | **560,422** | **100.00** |

**සටහන 10**

**2011 සිට 2015 දක්වා දේශීය ආදායම් රැස්කිරීම් බදු අනුව විශ්ලේෂණය**



## 2015.12.31 දිනට තක්සේරු අංශ අතර කාර්ය මණ්ඩලය සඳහා ලිපිගොනු හා ආදායම් බෙදී යාම

| තක්සේරු අංශය | කාර්ය මණ්ඩලය | | | | | | | ලිපිගොනු | | | | | | | | ආදායම (රු. මිලියන) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කො. | නි.කො. | තක්. | ජ්‍යෙ.බ.නි. | බ.නි. | වෙනත් | එකතුව | අ.බ./ර.ගැ.බ. | කි.වෘ. | එ.අ.බ./වි.එ.අ.බ. | ජා.ගො.බ. | උ.වි.ගෙ. | ආ.සේ.ගා. | ඔ.සු./මු.බ. | රා.නො.සං. | ආ.බ./ස.ව.බ. | උ.වි.ගෙ. | ආ.සේ.ගා. | එ.අ.බ./භා.සේ.බ./වි.එ.අ.බ. | ජා.ගො.බ. | පි.බ./ඔ.සු./වෙනත් | භ.බ./කො.හු.බ. | මු.බ./ඉ.බ. | එකතුව |
| ජාත්‍යන්තර අංශය | 2 | - | 16 | - | - | 21 | 39 | 84 | 1,754 | 100 | 30 | 114 | 21 | - | 186 | 7,152.24 | 634.37 | 93.81 | 491.17 | 54.62 | - | - | - | 8,426.21 |
| 1 හා 2 අංශය | 2 | - | 20 | - | - | 14 | 36 | 4,231 | - | - | 9 | - | 20 | - | - | 964.91 | - | 0.13 | - | 2.92 | - | - | - | 967.95 |
| 4 අංශය | 1 | 1 | 9 | - | - | 11 | 22 | 989 | - | 754 | 603 | 718 | 91 | - | - | 1,102.75 | 314.95 | 110.73 | 1,572.16 | 741.05 | 0.06 | - | - | 3,841.71 |
| 5 අංශය | 1 | - | 10 | 1 | - | 12 | 24 | 861 | - | 705 | 560 | 701 | 50 | - | - | 1,432.81 | 547.15 | 123.26 | 1,654.02 | 582.42 | 18.64 | - | - | 4,358.30 |
| 12 අංශය | 1 | - | 15 | - | - | 10 | 26 | 872 | 7 | 859 | 439 | 752 | 752 | - | 1 | 1,507.92 | 448.99 | 154.75 | 1,719.11 | 571.71 | 0.00 | - | - | 4,402.48 |
| 14 අංශය | 1 | - | 15 | - | - | 15 | 31 | 2,876 | - | 529 | 381 | 244 | 16 | - | - | 378.65 | 83.56 | 34.35 | 912.18 | 351.86 | - | - | - | 1,760.60 |
| 15 අංශය | 1 | 1 | 13 | - | - | 13 | 28 | 1,792 | - | 642 | 458 | 311 | 34 | - | - | 473.92 | 54.19 | 51.81 | 663.42 | 231.27 | - | - | - | 1,474.61 |
| 4A අංශය | 1 | - | 13 | - | - | 11 | 25 | 2,201 | - | 616 | 531 | 459 | 26 | - | - | 761.81 | 142.29 | 49.44 | 724.34 | 345.19 | 0.04 | - | - | 2,023.11 |
| 5C අංශය | 1 | 1 | 14 | - | - | 11 | 27 | 3,469 | - | 630 | 413 | 862 | 18 | - | - | 740.33 | 140.24 | 56.21 | 682.23 | 301.20 | 0.41 | - | - | 1,920.62 |
| 5D අංශය | 1 | 1 | 13 | 3 | - | 11 | 29 | 2,960 | - | 457 | 316 | 952 | 39 | - | - | 669.04 | 119.24 | 36.87 | 484.14 | 213.20 | 4.82 | - | - | 1,527.32 |
| 17 අංශය | 1 | 1 | 14 | 2 | - | 13 | 31 | 6,210 | - | 860 | 651 | 605 | 66 | - | - | 701.04 | 402.50 | 104.79 | 3,095.58 | 838.99 | 0.00 | - | - | 5,142.91 |
| 4B අංශය | 1 | - | 14 | - | - | 10 | 25 | 2,211 | - | 489 | 306 | 427 | 98 | - | - | 403.46 | 118.44 | 52.15 | 1,071.91 | 312.62 | - | - | - | 1,958.58 |
| 13 අංශය | 1 | - | 19 | - | - | 10 | 30 | 4,357 | - | 1,443 | 1,769 | 906 | 627 | - | - | 608.59 | 102.32 | 59.81 | 1,283.84 | 577.93 | 0.02 | - | - | 2,632.49 |
| 5E අංශය | 1 | - | 14 | - | - | 11 | 26 | 3,356 | - | 624 | 407 | 918 | 158 | - | - | 518.38 | 201.50 | 91.48 | 638.49 | 324.23 | 0.01 | - | - | 1,774.10 |
| 5F අංශය | 1 | - | 13 | - | - | 9 | 23 | 2,057 | - | 484 | 295 | 1,046 | 275 | - | - | 346.34 | 183.83 | 58.53 | 552.32 | 231.26 | - | - | - | 1,372.28 |
| 16 අංශය | 1 | - | 17 | - | - | 10 | 28 | 2,929 | - | 724 | 781 | 474 | 324 | - | - | 559.86 | 95.61 | 87.11 | 1,266.54 | 577.52 | 6.09 | - | - | 2,592.73 |
| 18 අංශය | 1 | - | 17 | - | - | 8 | 26 | 5,602 | - | 870 | 479 | 741 | 40 | - | - | 1,319.87 | 549.91 | 89.31 | 1,766.75 | 785.96 | - | - | - | 4,511.81 |
| 6A අංශය | 2 | 1 | 13 | - | - | 16 | 32 | 404 | - | 399 | 389 | 338 | 63 | - | - | 13,427.39 | 2,040.13 | 541.82 | 11,879.40 | 5,685.74 | 0.00 | - | - | 33,574.47 |
| 7A අංශය | 2 | 2 | 11 | 1 | - | 18 | 34 | 470 | 3 | 407 | 396 | 418 | 295 | - | - | 18,374.90 | 5,019.27 | 1,187.55 | 18,229.18 | 4,751.26 | 0.11 | - | - | 47,562.26 |
| 7B අංශය | 2 | 1 | 12 | - | 1 | 15 | 31 | 438 | - | 389 | 358 | 365 | 43 | - | - | 12,946.82 | 2,106.23 | 522.04 | 10,922.28 | 2,817.43 | 0.02 | - | - | 29,314.82 |
| 8 අංශය | 2 | - | 12 | - | - | 15 | 29 | 431 | 8 | 443 | 352 | 400 | 431 | - | - | 24,767.71 | 3,137.44 | 867.49 | 9,808.03 | 2,639.36 | 0.00 | - | - | 41,220.02 |
| 6 C අංශය | 2 | 2 | 16 | - | - | 23 | 43 | 316 | 6 | 377 | 353 | 198 | 102 | - | - | 51,494.00 | 4,472.01 | 309.08 | 42,925.09 | 6,799.68 | 0.02 | - | - | 105,999.87 |
| 10 අංශය | 2 | 2 | 16 | - | - | 16 | 36 | 659 | - | 428 | 365 | 463 | 376 | - | - | 11,202.73 | 2,867.01 | 1,020.96 | 13,901.69 | 4,285.89 | 3.82 | - | - | 33,282.11 |
| ර.ගැ.බ. (පොළී මත) | 1 | - | 11 | - | - | 7 | 19 | 3,424 | - | - | - | - | - | - | - | 63,457.56 | - | - | - | - | - | - | - | 63,457.56 |
| උ.වි.ගෙ. අංශය | 1 | - | 9 | - | - | 10 | 20 | - | - | - | - | 1,337 | - | - | - | 2,334.56 | 90.13 | - | - | - | - | 1,558.87 | - | 3,983.56 |
| ඔට්ටු හා සූදු බදු අංශය | 1 | - | 4 | - | - | 5 | 10 | - | - | - | - | - | - | 627 | - | - | - | - | - | - | 831.92 | - | - | 831.92 |
| එ.අ.බ. අංශය | 2 | - | 17 | - | - | 18 | 37 | - | - | 2,696 | - | - | - | - | - | - | - | - | 5,260.95 | - | - | - | - | 5,260.95 |
| මුද්දර බදු අංශය | 1 | 1 | 16 | - | - | 13 | 31 | - | - | - | - | - | - | 8,393 | - | - | - | - | - | - | 0.09 | - | 12,625.22 | 12,625.31 |
| **ප්‍රාදේශීය කාර්යාල** | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| කොළඹ දකුණ | 1 | 1 | 19 | - | - | 17 | 38 | 8,050 | - | - | 345 | - | 8 | - | - | 1,203.84 | - | 6.95 | - | 185.98 | - | - | - | 1,396.77 |
| කොළඹ මධ්‍යම | 1 | 2 | 16 | - | - | 12 | 31 | 7,175 | - | - | 895 | - | - | - | - | 959.38 | - | 18.68 | - | 519.26 | 0.73 | - | - | 1,498.04 |
| කොළඹ නගර | 1 | 1 | 21 | - | - | 20 | 43 | 7,589 | - | - | 1,222 | - | - | - | - | 776.58 | - | 5.83 | - | 550.59 | - | - | - | 1,333.01 |
| මහරගම නැගෙනහිර | 1 | - | 25 | - | - | 12 | 38 | 9,854 | - | - | 797 | - | - | - | - | 411.11 | - | 3.56 | - | 348.50 | - | - | - | 763.16 |
| මහරගම බටහිර | 1 | - | 22 | - | - | 13 | 36 | 9,818 | - | - | 720 | - | 2 | - | - | 569.31 | - | 5.85 | 0.17 | 252.75 | 1.89 | - | - | 829.96 |
| බදුල්ල | 1 | - | 13 | - | - | 18 | 32 | 5,198 | - | - | 412 | - | - | - | - | 264.87 | - | 3.72 | - | 213.56 | - | - | - | 482.16 |
| ගාල්ල | 1 | - | 25 | - | - | 16 | 42 | 7,249 | - | - | 531 | - | 4 | - | - | 256.49 | - | 10.36 | - | 213.37 | - | - | - | 480.23 |
| කළුතර | 1 | - | 21 | - | - | 23 | 45 | 8,543 | - | - | 493 | - | - | - | - | 229.47 | - | 1.44 | - | 192.16 | - | - | - | 423.07 |
| මාතර | 1 | - | 21 | - | - | 25 | 47 | 8,707 | - | - | 522 | - | - | - | - | 292.04 | - | 7.22 | - | 250.03 | - | - | - | 549.29 |
| නුවරඑළිය | 1 | - | 16 | - | - | 15 | 32 | 4,078 | - | - | 362 | - | - | - | 9 | 174.73 | - | 0.62 | - | 153.75 | - | - | - | 329.10 |
| රත්නපුර | 1 | - | 11 | - | - | 13 | 25 | 6,817 | - | - | 572 | - | 4 | - | - | 291.94 | - | 11.91 | - | 239.29 | - | - | - | 543.13 |
| අනුරාධපුර | 1 | - | 20 | - | - | 18 | 39 | 4,373 | - | - | 390 | - | - | - | - | 314.36 | - | 5.24 | - | 188.59 | - | - | - | 508.18 |
| ගම්පහ | 1 | - | 21 | - | - | 13 | 35 | 11,792 | - | - | 884 | - | 2 | - | - | 508.75 | - | 12.12 | - | 514.82 | - | - | - | 1,035.69 |
| මඩකලපුර | 1 | - | 11 | - | - | 15 | 27 | 4,458 | - | - | 315 | - | - | - | - | 140.64 | - | 2.09 | - | 125.07 | - | - | - | 267.80 |
| යාපනය | 1 | - | 2 | - | - | 17 | 20 | 2,307 | - | - | 396 | - | - | - | - | 99.16 | - | 1.24 | - | 140.76 | - | - | - | 241.17 |
| මහනුවර | 1 | 1 | 38 | - | - | 22 | 62 | 9,500 | - | - | 578 | - | 1 | - | - | 616.54 | - | 6.00 | - | 339.25 | - | - | - | 961.79 |
| කෑගල්ල | 1 | 2 | 14 | - | - | 22 | 39 | 4,427 | - | - | 246 | - | - | - | - | 177.45 | - | 0.26 | - | 120.73 | - | - | - | 298.44 |
| කුරුණෑගල | 1 | - | 32 | - | - | 20 | 53 | 9,307 | - | - | 432 | - | - | - | - | 406.03 | - | 8.23 | - | 306.46 | - | - | - | 720.72 |
| දඹුල්ල | 1 | 1 | 25 | - | - | 15 | 42 | 4,719 | - | - | 424 | - | 38 | - | - | 206.59 | - | 0.79 | - | 197.48 | - | - | - | 404.86 |
| මීගමුව | 1 | 1 | 21 | | | 15 | 38 | 9,867 | - | - | 679 | - | - | - | - | 423.18 | - | 3.39 | - | 315.88 | - | - | - | 742.45 |
| **එකතුව** | **57** | **23** | **777** | **7** | **1** | **697** | **1,562** | **197,027** | **1,778** | **15,925** | **21,856** | **13,749** | **4,024** | **9,020** | **196** | **225,970.03** | **23,871.29** | **5,818.99** | **131,505.02** | **39,391.59** | **868.68** | **1,558.87** | **12,625.22** | **441,609.69** |

| | |
|---|---|
| **අආනයන මත එ.අ.බ.** | **83,603.09** |
| **ආනයන මත ජා.ගො.බ.** | **26,469.27** |
| **භාණ්ඩාගාර පැවරුම්** | **7,853.11** |
| **ආපසු ගෙවීම්** | **(1,003.17)** |
| **ගැලපුම්, වර්ගීකරණය නොකළ ආදායම, අගරු චෙක්පත් සහ අනෙකුත්** | **1,890.37** |
| **ශුද්ධ රැස්කිරීම් (පළාත් සභාවලට මාරු කරන ලද මුද්දර බදු සහ ජා.ගො.බ. ප්‍රමාණයෙන් 1/3 ක් ද ඇතුළත් ය.)** | **560,422.36** |

# පරිච්ඡේදය 3

# වියදම් සහ ඵලදායිතා අනුපාතය

වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් මිලියන 4,437 ක් වූ අතර, පසුගිය වසරේ අගය වූ රුපියල් මිලියන 3,088 සමඟ සසඳා බැලීමේ දී එය 43.69% ක ඉහළයාමක් වාර්තා කරයි. මුළු වියදමෙන් 54.73% ක් නැතහොත් රු.මිලියන 2,428 ක් පුනරාවර්තන වියදම් සඳහා වැය කරන ලදි. 2014 වසරේ දී, අනුරූපී අගය රු.මිලියන 2,002 ක් විය. වේතන සඳහා වූ වියදම 2014 වසරේ පැවති රු.මිලියන 1,413 ට සාපේක්ෂව 26.14% කින් ඉහළ යාමකි. මුළු වියදමෙන් 40.19% ක් සහ පුනරාවර්තන වියදමෙන් 73.44% කින් සමන්විත වූ මෙම අගය විශාලතම තනි වියදම් අයිතමය විය.


2014 වර්ෂය හා සසඳා බලන කළ වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය 85.04%ක වැඩිවීමක් වාර්තා කරන ලද අතර එය රු.මිලියන 2,009 ට ළඟා වී ඇත. මෙම අගය 2014 වසරේ දී රු.මිලියන 1,085 ක් විය. දෙපාර්තමේන්තුවේ මුළු වියදමෙන් 45.27% ක් ප්‍රාග්ධන වියදම් නියෝජනය කරයි.


2013 වසරේ ප්‍රකාශිත අයවැය යෝජනා පරිදි, දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂතාවය ඉහළ නැංවීමේ අරමුණ පෙරදැරිව ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම පිණිස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මූලික පියවර ගන්නා ලද අතර වසර තුළ මෙම ව්‍යාපෘතියට අදාළව කරන ලද ආයෝජනය රු.මිලියන 1,518 ක් විය.

## 3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම් 2013, 2014 සහ 2015 වර්ෂ සමඟ සැසඳීම

**වගුව 21 - මුළු වියදම් 2013, 2014 සහ 2015 වර්ෂ සමඟ සැසඳීම**

| විස්තරය | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|
| | ( රු.'000 ) | % | ( රු.'000 ) | % | ( රු.'000 ) | % |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පඩිනඩි | 1,272,722 | 67.85% | 1,413,734 | 45.78% | 1,783,351 | 40.19% |
| ගමන් වියදම් | 19,124 | 1.02% | 17,722 | 0.57% | 22,337 | 0.50% |
| සැපයුම් | 67,269 | 3.59% | 103,684 | 3.36% | 86,449 | 1.95% |
| නඩත්තු | 30,999 | 1.65% | 63,671 | 2.06% | 47,768 | 1.08% |
| කොන්ත්‍රාත් සේවා | 265,284 | 14.14% | 372,162 | 12.05% | 453,239 | 10.21% |
| පැවරුම් | 27,871 | 1.49% | 31,438 | 1.02% | 35,268 | 0.79% |
| **උප එකතුව** | **1,683,269** | **89.73%** | **2,002,411** | **64.85%** | **2,428,412** | **54.73%** |
| **ප්‍රාග්ධන වියදම්** | | | | | | |
| ප්‍රතිසංස්කරණ සහ වැඩිදියුණු කිරීම් | 131,414 | 7.01% | 101,614 | 3.29% | 73,624 | 1.66% |
| ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම | 40,243 | 2.15% | 49,343 | 1.60% | 31,820 | 0.72% |
| ධාරිතා ගොඩනැගීම | 20,963 | 1.12% | 127,793 | 4.14% | 385,170 | 8.68% |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | | | 806,802 | 26.13% | 1,518,108 | 34.21% |
| **උප එකතුව** | **192,620** | **10.27%** | **1,085,552** | **35.15%** | **2,008,722** | **45.27%** |
| **මුළු එකතුව** | **1,875,889** | **100%** | **3,087,963** | **100.00%** | **4,437,134** | **100.00%** |



### 3.2 ඵලදායිතා අනුපාතය

2015 වසරේ දී දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් 4,436,933,990/- ක් වූ අතර, රැස්කළ ආදායම රුපියල් 560,422,362,100/- ක් විය. එබැවින් ඵලදායීතා අනුපාතය (එනම් වියදම් කළ සෑම රුපියලක් සඳහාම රැස්කළ ආදායම) 126:1 ක් ලෙස ගණනය කෙරේ. එනම් රැස්කිරීමේ පිරිවැය ශත 79 කි. රුපියල් 100 ක් රැස්කිරීමේ පිරිවැය ආනයනය මත එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු රහිතව ගත් කළ ශත 98 කි. (පෙර වර්ෂයේ දී අනුරූපී අගයන් පිළිවෙලින් ශත 60 සහ ශත 79 ක් විය.)

2013 - 2015 වසර දක්වා ආදායම් රැස්කිරීම, මුළු වියදම් සහ රැස්කිරීමේ පිරිවැය වර්ගීකරණයක් 22 වන වගුවෙහි දැක්වේ

වගුව 22 - ආදායම් රැස් කිරීම, මුළු වියදම හා රැස්කිරීමේ පිරිවැය ( රු. මිලියන)

| විස්තරය | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| **ආදායම් රැස් කිරීම** | | | |
| ආදායම් බද්ද | 199,070.03 | 191,960.05 | 256,434.94 |
| ආර්ථික සේවා ගාස්තු | 6,595.60 | 6,154.51 | 6,148.45 |
| එකතු කළ අගය මත බද්ද | 217,686.92 | 237,915.43 | 214,236.99 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 59,397.33 | 65,353.98 | 67,911.06 |
| හර බද්ද | -0.08 | - | - |
| ඔට්ටු හා සූදු බද්ද | 591.87 | 815.18 | 831.92 |
| කොටස් ගනුදෙනු බද්ද | 1,197.41 | 2,048.05 | 1,394.92 |
| පිරිවැටුම් බද්ද | 218.08 | 472.18 | 15.77 |
| මුද්දර බද්ද | 6,884.39 | 7,918.14 | 11,595.88 |
| භාණ්ඩ හා සේවා බද්ද | 15.97 | 3.46 | 0.89 |
| ජාතික ආරක්ෂක බද්ද | 2.15 | 13.77 | 11.63 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 750.91 | 841.83 | 753.31 |
| ඉඩම් බද්ද | 96.74 | 579.47 | 1,066.64 |
| සමාජ වගකීම් බද්ද | 32.11 | 84.66 | 19.96 |
| **මුළු එකතුව** | **492,539.43** | **514,160.71** | **560,422.36** |
| **වියදම්** | | | |
| **පුනරාවර්තන වියදම්** | | | |
| පඩිනඩි | 1,272.72 | 1,413.73 | 1,783.35 |
| ගමන් වියදම් | 19.12 | 17.72 | 22.34 |
| සැපයුම් හා උපකරණ | 67.27 | 103.68 | 86.45 |
| නඩත්තු හා අලුත්වැඩියා | 31 | 63.67 | 47.77 |
| සේවා | 265.28 | 372.16 | 453.24 |
| මාරු කිරීම් | 27.87 | 31.44 | 35.27 |
| වෙනත් | | | |
| ප්‍රාග්ධන වියදම් | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම් | 131.41 | 101.61 | 73.62 |
| අත්පත්කර ගැනීම් | 40.24 | 49.34 | 31.82 |
| ධාරිතා ගොඩනැගිලි | 20.96 | 127.79 | 385.17 |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | - | 806.8 | 1,518.11 |
| **මුළු වියදම** | **1,875.89** | **3,087.94** | **4,437.14** |
| | | | |
| රු. 100 බැගින් එකතු කිරීමේ පිරිවැය | **0.38** | **0.6** | **0.79** |
| ආනයනමත එකතු කළ අගය මත බදු හා ජා.ගොඩ. බදු හැර රු.100 බැගින් එකතු කිරීමේ පිරිවැය | **0.5** | **0.79** | **0.98** |

### 3.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය මගින් සිදුකරන ලද විගණනවලට සියලු වියදම් එනම්, දෛනික වාහන ධාවන සටහන් (ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වාගෙන යනු ලබන), පඩි ලැයිස්තු, වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා, බැංකු සැසඳුම් ප්‍රකාශන (මහජන බැංකුව, ලංකා බැංකුව සහ මහ බැංකුව) පරීක්ෂා කිරීම ඇතුළත් විය. තවද, මෙයට අතිරේක වශයෙන්, අගරු චෙක්පත්වල මුදල් අයකර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග, එ.අ.බ. සහ ආදායම් බදුවලින් ආපසු ගෙවීම්, අග්‍රිම ගිණුම් සහ අග්‍රිම මුදල් ගිණුම් පරීක්ෂා කිරීම අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

# පරිච්ඡේදය 4
# පැහැර හරින ලද බදු

## 4.1 පැහැර හරින ලද බදු

23 වන වගුවෙන් 2015.12.31 දිනට පැහැර හරින ලද බදු ප්‍රමාණය, අත්හිටවූ බදු ප්‍රමාණය, දණ්ඩන සහ රැස් කරගත හැකි පැහැර හැර ඇති බදු ප්‍රමාණය නිරූපණය කරයි.

**වගුව 23 - පැහැර හරින ලද බදු විශ්ලේෂණය - 2015.12.31 දිනට**

| බදු වර්ගය | පැහැර හරින ලද දළ බද්ද (රු.) | දඩ මුදල (රු.) | දණ්ඩන හැර මතභේදයට තුඩු දුන් බදු (රු.) | මතභේදයට තුඩු දුන් බදුවලට අදාළ දණ්ඩන (රු.) | රැස් කළ හැකි බදු (රු.) | රැස් කළ හැකි දණ්ඩන(රු.) |
|---|---|---|---|---|---|---|
| ආදායම් බද්ද | 85,525,191,768 | 47,992,967,193 | 70,724,051,005 | 43,187,961,891 | 14,801,140,763 | 4,805,005,302 |
| ආදායම් බද්ද මත අධිභාරය | 330,273,865 | 266,625,899 | 328,987,850 | 265,383,865 | 1,286,015 | 1,242,034 |
| ආදායම් බද්ද (පොළිය මත රඳවා ගැ. බදු) | 1,495,289,225 | 696,636,514 | 1,472,896,677 | 651,064,332 | 22,392,548 | 45,572,182 |
| එ.අ.බ. | 49,378,761,998 | 35,248,527,728 | 44,218,320,939 | 31,014,577,120 | 5,160,441,059 | 4,233,950,608 |
| එ.අ.බ. (මූල්‍ය සේවා) | 7,356,520,901 | 4,394,871,900 | 7,304,890,192 | 4,371,304,138 | 51,630,709 | 23,567,762 |
| ආ.සේ. ගා. | 4,629,887,138 | 4,161,928,938 | 3,644,746,541 | 3,540,616,152 | 985,140,597 | 621,312,786 |
| ජා.ගො.බ. | 3,828,081,529 | 4,196,471,475 | 2,332,907,259 | 2,846,670,584 | 1,495,174,270 | 1,349,800,891 |
| මුද්දර බද්ද | 9,732,724 | 3,773,302 | - | - | 9,732,724 | 3,773,302 |
| හර බද්ද | 2,215,581,368 | - | 2,215,581,368 | - | - | - |
| පිරිවැටුම් බද්ද | 2,436,857,570 | 1,205,171,114 | 2,436,857,570 | 1,205,171,114 | - | - |
| භාණ්ඩ හා සේවා බද්ද | 943,355,822 | 1,022,819,837 | 943,355,822 | 1,022,819,837 | - | - |
| ජාතික ආරක්ෂක බද්ද | 1,373,143,369 | 575,787,753 | 1,373,143,369 | 575,787,753 | - | - |
| ජාතිය ගොඩනැගීමේ දායක මුදල | 16,087,126 | 4,811,953 | 16,087,126 | 4,811,953 | - | - |
| ධන බද්ද | 851,542 | 455,551 | 851,542 | 455,551 | - | - |
| ත්‍යාග බද්ද | 2,409 | 1,204 | 2,409 | 1,204 | - | - |
| සමාජ වගකීම් බද්ද | 1,980,457 | 151,434 | 1,969,992 | 146,995 | 10,465 | 4,439 |
| සමථයකට පත්වන දණ්ඩන | - | 215,435,611 | - | 103,551,506 | - | 111,884,105 |
| **එකතුව** | **159,541,598,811** | **99,986,437,406** | **137,014,649,661** | **88,790,323,995** | **22,526,949,150** | **11,196,113,411** |

සටහන:

i. අදාළ එක් එක් බදු වර්ගය යටතේ පවත්නා වූ සමුච්චිත ශේෂ ප්‍රමාණය මුළු හිඟබදු ප්‍රමාණය මගින් නියෝජනය කෙරේ. කෙසේ වෙතත්, ඉහත වර්ගීකරණය කර ඇති පරිදි නොගෙවූ බදු ඒ ස්වරූපයෙන් ම සම්පූර්ණයෙන් ම හිඟව නොපවතී.

ii. කවර වූ හේතුවක් මත තක්සේරුවක් නිකුත් කරනු ලබන අවස්ථාවක දී (බදු ගෙවන්නා විසින් වාර්තා ඉදිරිපත් නොකිරීම, වාර්තාව පදනම් කොට ගෙන බදු නොගෙවීම, සාවද්‍ය වාර්තා හෝ ප්‍රකාශන ඉදිරිපත් කිරීම යනාදී) නොගෙවූ හෝ හිඟ මුදලක් උද්ගත වේ. නියමිත දිනට බදු නොගෙවීම වෙනුවෙන් දණ්ඩන මුදල සාමාන්‍යයෙන් 10% ක් වන අතර, ආදායම් බදු සම්බන්ධයෙන් එය 50% ක බදු ප්‍රමාණයක් කරා ළඟා වනතුරු නොගෙවන ලද සෑම මාසයක් සඳහා ම 2% ක ප්‍රමාණයක් සහ එ.අ.බ. සම්බන්ධයෙන් 100% ක ප්‍රමාණයක් වේ.

iii. තක්සේරු කිරීම්වලට එරෙහිව බදු ගෙවන්නන් විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී සහ ඉන් අනතුරුව ඔවුන් විසින් තම අභියාචනා අයිතිවාසිකම් සඳහා ඉල්ලුම්කර ඇති පරිදි නිරාකරණය කිරීම සිදු කරනු ලබන විට ඇතැම් නඩු අවස්ථා සම්බන්ධයෙන් ඉහළ

අභියාචනා මට්ටම් දක්වා (අභියාචනා කොමිසම, අභියාචනාධිකරණය ආදිය) අදාළ බදු පැහැර හරින ලද බදු ලෙස සලකනු ලැබේ. මෙම බදු ප්‍රමාණයන් මතභේදයට තුඩු දුන් බදු, දණ්ඩන හෝ අත්හිට වූ බදු ලෙස වර්ගීකරණය කළහැකි ය. අභියාචනා විසඳීමේ දී එකතු කරන ලද දණ්ඩන සමඟ තක්සේරු කළ යම් අතිරේක ප්‍රමාණය විසර්ජනය කළයුතු වේ.

## 4.2 පැහැර හරින ලද බදු අඩුකිරීම සඳහා සැලසුම්

(අ) හිඟ බදු අයකර ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සහ පියවරයන් අදාළ ප්‍රඥප්තීන් හි දැක්වේ. තක්සේරු නිකුත් කිරීමෙන් එවැනි පියවර අඛණ්ඩව ගනු ලැබුව ද, සැලකිය යුතු බදු ප්‍රමාණයක් හිඟව පවත්නා බව ද දැක ගත හැකිය.

(ආ) 2010 අංක 16 දරන හිඟ බදු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි හිඟ බදු අයකර ගැනීමේ අංශය විසින් අදාළ හිඟ බදු වාර්තා පිළියෙල කර ඇති අතර, අතිරේක අධිකාරිත්වයක් සහිත ඵලදායී ලෙස බදු ආපසු අයකර ගැනීමේ කටයුතු තුළින් වඩාත් යහපත් ප්‍රතිඵල අපේක්ෂා කෙරේ. (යම් යම් අවස්ථාවන්හි දී හිඟ බදු අයකර ගැනීම සඳහා මෙන්ම ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කාරණා සම්බන්ධයෙන් විධිමත් සහ වේගවත් ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා වන පනතකි.)

## 4.3 හිඟ බදු ප්‍රමාණය 3% මට්ටමෙහි පවත්වා ගැනීම.

2010 අංක 16 දරන හිඟ බදු (විශේෂ විධිවිධාන) පනතෙහි 12 වන වගන්තිය ප්‍රකාරව, 2010 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් ලත් වර්ෂයක අවසානය වන විට මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන යම් නීතියක් යටතේ පැහැර හැර ඇති එහෙත් ඊට උපචිත වූ මුදලක් හෝ අත්හිට වූ හෝ විලම්භනය කරන ලද බදු මුදලක කොටස හැර, බදුවල මුළු එකතුව ඊට පෙරාතුව වූ වර්ෂයේ මුළු බදුවල එකතුවට වැඩිවන්නේ යම් ප්‍රමාණයකින් ද, එම බදු මුදල් ප්‍රමාණය එකී පෙරාතුවම වූ වර්ෂයේ එම නීතිය යටතේ පනවනු ලැබූ සහ නියම කරනු ලැබූ බදුවලින් සියයට තුනක් නොඉක්මවන බවට වගබලාගැනීම කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

ඒ අනුව,

| | |
|---|---|
| 2015.12.31 දිනට ශුද්ධ හිඟබදු ප්‍රමාණය | Rs. 22,526,949,150 |
| <u>අඩු කළා</u> | |
| 2014.12.31 දිනට ශුද්ධ හිඟබදු ප්‍රමාණය | Rs. 17,278,517,597 |
| 2015 වර්ෂයේ හිඟ බදු වැඩිවීම | **Rs. 5,248,431,553** |
| 2014.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු බදු රැස්කිරීම් | Rs. 485,387,055,372 |
| 2014 වර්ෂයේ මුළු බදු රැස්කිරීම් වලින් 3% | **Rs. 14,561,611,661** |

එබැවින් 2015 වසරේ දී හිඟ බදුවල ශුද්ධ එකතුවීමක් දක්නට නොමැත. ඒ අනුව 2010 අංක 16 දරන හිඟ බදු (විශේෂ විධිවිධාන) පනතින් අපේක්ෂිත ආකාරයට එම අගය පෙර වර්ෂයේ මුළු බදු රැස්කිරීමෙන් 3% කට වඩා අඩු අගයක් ගනී.

# පරිච්ඡේදය 5

# විගණන, අතිරේක බදු රැස්කිරීම, ආපසු ගෙවීම්, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා

## 5.1 විගණන

ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ඒකකයෙහි ස්වභාවය හා විශාලත්වයට අනුකූලව, සමස්ත බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව හැකි පමණ පුළුල් ලෙසින් ආවරණය කිරීමේ අරමුණින් යුතුව 2015 වසර තුළ දී විගණන සහ විමර්ශන කටයුතු සිදුකරන ලදි. විමර්ශන සම්පත් වඩාත් ඵලදායී ලෙස භාවිත කිරීම තුළින් සුවිශාල බදු ගෙවන්නන්ට අදාළව ලාභාංශ ගෙවා ඇති බව නිරීක්ෂණය වී ඇත. සමාලෝචනයට බඳුන් කරන වසර තුළ, අවසන් රාජකාරිය (back duty) සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමේ මහඟු ඵල ගෙන දෙමින් මෙම වර්ගය සම්බන්ධයෙන් තේරීමේ ක්‍රියාවලිය දැඩි අවධානයට යොමු කර ඇත.

**වගුව 24 - වර්ෂය තුළ සිදුකරන ලද විගණන සහ අතිරේක බදු රැස්කිරීම පිළිබඳ විස්තර (රු.’000)**

| | ආදායම් බද්ද | එ.අ.බ. | ආ.සේ.ගා. | උ.වි.ගෙ. | ජා.ගො.බ. | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂය තුළ තක්සේරු කරන ලද මුළු අතිරේක බදු ප්‍රමාණය | 13,525,689 | 5,507,366 | 347,928 | 365,003 | 1,627,740 | 163,518 | 21,537,244 |
| වර්ෂය තුළ රැස්කරන ලද මුළු අතිරේක බදු ප්‍රමාණය | 11,330,761 | 4,353,781 | 275,612 | 105,558 | 893,916 | 63,335 | 17,022,963 |
| 2015 වර්ෂය තුළ දී ආරම්භ කරන ලද විගණන සංඛ්‍යාව | **6,577** | | | | | | |
| 2015 වර්ෂය තුළ දී අවසන් කරන ලද විගණන සංඛ්‍යාව | **6,350** | | | | | | |

**වගුව 25 - සංස්ථාපිත සහ අනෙකුත් අංශ වලින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය (දණ්ඩන ඇතුළුව)**

| විස්තරය | තක්සේරු කරන ලද හා එකඟ වූ අතිරේක ආදායම/පිරිවැටුම (රු.) | සංස්ථාපිත විශාල බදු ගෙවන්නන් | | | | රැස් කරන ලද අතිරේක බදු (රු.) හිලව් කළ ආපසු ගෙවීම් ඉල්ලීම් ඇතුළුව) |
|---|---|---|---|---|---|---|
| | | සංස්ථාපිත විශාල බදු ගෙවන්නන් | සංස්ථාපිත අනෙකුත් | අනෙකුත් ඒකක | එකතුව | |
| ආදායම් බද්ද | 71,840,005 | 10,176,596 | 1,389,126 | 1,959,967 | 13,525,689 | 11,330,761 |
| එකතු කළ අගය මත බද්ද | 24,292,676 | 1,293,388 | 1,389,247 | 2,824,731 | 5,507,366 | 4,353,781 |
| ආර්ථික සේවා ගාස්තු | 55,980,053 | 258,139 | 82,309 | 7,480 | 347,928 | 275,612 |
| උපයන විට ගෙවීම් | 5,094,808 | 55,238 | 66,204 | 243,561 | 365,003 | 105,558 |
| ජ.ගො.බ. | 66,972,450 | 621,656 | 436,090 | 569,994 | 1,627,740 | 893,916 |
| අනෙකුත් | 1,244,775 | 106,124 | 48,114 | 9,280 | 163,518 | 63,335 |
| **එකතුව** | **225,424,767** | **12,511,141** | **3,411,090** | **5,615,013** | **21,537,244** | **17,022,963** |

## 5.2 අභියාචනා

තක්සේරුවලට එරෙහිව ලැබූ අභියාචනා 660 ක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ දී විසඳා අවසන් කරන ලද අතර අභියාචනා විශ්ලේෂණය කිරීමේ තත්ත්වය පහත සඳහන් පරිදි වේ.

**වගුව 26 - ලැබූ සහ නිරාකරණය කරන ලද අභියාචනා සම්බන්ධ විශ්ලේෂණය**

| | | ආදායම් බද්ද | එකතු කළ අගය මත බද්ද | ආර්ථික සේවා ගාස්තු | ජාතිය ගොඩනැගීමේ බදු | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2015.01.01 දිනට ශේෂය** | අංශ APL 2 පරිදි | 129 | 9 | 0 | 6 | 0 | 144 |
| | අභියාචනා අංශය (APL 2 පරිදි) | 130 | 193 | 4 | 127 | 3 | 457 |
| | දේ.ආ.කො.ජ. විසින් අභියාචනා විමර්ශනයට භාජනය කිරීම | 66 | 85 | 0 | 34 | 0 | 185 |
| **වර්ෂය තුළ දී ලියාපදිංචිය (APL 2 පරිදි)** | | | **323** | **9** | **285** | **26** | **1097** |
| **අවසන් කළ** | නිර්ණය කරන ලද (දේ.ආ.කො.ජ.) | 33 | 46 | 0 | 21 | 0 | 100 |
| | අංශ (APL 4 පරිදි) | 184 | 8 | 0 | 36 | 0 | 225 |
| | අභියාචනා අංශය | 121 | 100 | 5 | 101 | 8 | 335 |
| **දේ.ආ.කො.ජ. ට විභාගය සඳහා ඉදිරිපත් කළා** | | | **2111** | **1** | **117** | **2** | **470** |
| **2015.12.31 දිනට ශේෂය** | ඒකක (APL 2 පරිදි) | 91 | 0 | 0 | 70 | 2 | 163 |
| | *අභියාචනා අංශය (APL 2 පරිදි) | 178 | 209 | 7 | 94 | 17 | 505 |
| | දේ.ආ.කො.ජ. විසින් අභියාචනා විමර්ශනයට භාජනය කිරීම | 172 | 250 | 1 | 130 | 2 | 555 |
| ***වර්ෂය තුළ දී අභියාචනා අංශයට ලැබුණ ලිපිගොනු** | | | **189** | **4** | **100** | **11** | **447** |

## 5.3 එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණන

දෙපාර්තමේන්තුවේ එකතු කළ අගය මත බදු විශේෂ විගණන ඒකකය මගින් එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණනයන් ලෙස වර්ෂය තුළ දී සිද්ධීන් (ලිපිගොනු) 216 ක් සම්පූර්ණ කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් අතිරේක බදු ලෙස රු.399,505,866/- ක මුදලක් රැස්කරගත හැකි විය.

## 5.4 අය ක්‍රියා මාර්ග

වර්ෂය තුළ බදු අය කිරීම් සඳහා කටයුතු කළ සිද්ධි - ලිපිගොනු සංඛ්‍යාව හා නිවේදන සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

**වගුව 27 - අය ක්‍රියා මාර්ග**

| | සිද්ධීන් | දැන්වීම් |
|---|---|---|
| තහනම් නියෝග නිකුත් කිරීම | 3,608 | 3,663 |
| නඩු පැවරීම් | 2,939 | 830 |
| වෙනත් ක්‍රියා මාර්ග | 7,230 | 4,451 |

## 5.5 ආපසු ගෙවීම්

වර්ෂය තුළ දී සිදු කරන ලද ආපසු ගෙවීම් පිළිබඳ විශ්ලේෂණය (හිඟ බදු සඳහා හිලව් කළ ආපසු ගෙවීම් හැර) පහත දැක්වේ.

**වගුව 28 - ආපසු ගෙවීම් විශ්ලේෂණ**

| බදු වර්ගය | 2014 | | 2015 | |
|---|---|---|---|---|
| | ආපසු ගෙවීම් ප්‍රමාණය (රු.) | එක් එක් බදු වර්ගයේ රැස් කිරීම ශුද්ධ ආදායමට % | ආපසු ගෙවීම් ප්‍රමාණය (රු.) | එක් එක් බදු වර්ගයේ රැස් කිරීම ශුද්ධ ආදායමට % |
| එකතු කළ අගය මත බදු | 1,112,689,379 | 0.47% | 931,478,754 | 0.43% |
| සංස්ථාපිත ආදායම් බදු | 30,901,245 | 0.04% | 18,410,241 | 0.01% |
| වෙනත් සංස්ථාපිත නොවන ආදායම් බදු | 31,600,314 | 0.39% | 19,715,447 | 0.17% |
| නිශ්චිත ගාස්තු මත රඳවා ගැනීමේ බදු | 2,275,268 | 1.06% | 7,019,723 | 1.43% |
| පොළී මත රඳවා ගැනීමේ බදු | 8,214,435 | 0.01% | 757,209 | 0.00% |
| උපයන විට ගෙවීමේ බදු | 13,934,469 | 0.06% | 25,794,549 | 0.10% |
| එකතුව | **1,199,615,110** | **0.23%** | **1,003,175,923** | 0.18% |

වර්ෂය තුළදී එකතු කළ අගය මත ආපසු ගෙවීම් ඉල්ලීම් 8927 ක් සඳහා රු.මිලියන 931.48 ක් ආපසු ගෙවා අවසන් කරන ලදි. වසර තුළ දී ආපසු ගෙවන ලද මුළු මුදලින් රුපියල් මිලියන 102.31 ක මුදලක් සමස්ත හිඟ බදුවලට එරෙහිව මාරුකිරීම හෝ හිලව් කිරීම කරන ලදි.

සරළ කරන ලද එ.අ.බ. යෝජනා ක්‍රමය (SVAT), ණය වවුචර් නිකුත් කිරීමේ ක්‍රමය මගින් ආනයන සහ විශේෂ ව්‍යාපෘතිවල යෙදී සිටින එ.අ.බ. සඳහා ලියාපදිංචි වී සිටින පුද්ගලයන්ගෙන් එ.අ.බ. ආපසු ඉල්ලීම් සංඛ්‍යාව අවම කෙරෙයි. කොමසාරිස් ජනරාල් විසින් සුපරීක්ෂණය කරනු ලබන මෙම ස.එ.අ.බ. ක්‍රමය යටතේ සුදුසුකම් ලබන පුද්ගලයින් සඳහා සපයනු ලබන භාණ්ඩ හා සේවා ඔවුන්ගේ බද්දට යටත් ආදායමින් සියයට 50 ක් වන විට පුද්ගලයින් වැඩි සංඛ්‍යාවක් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට සුදුසුකම් ලබයි. එබැවින්, එ.අ.බ. රැස්කිරීමක් සිදුකළ නොහැකි අතර, මීට පෙර ගෙවන ලද එ.අ.බ. යෙදවුම් බදු ලෙස ඉල්ලීමක් කරන ලදි.

වසර තුළ දී පුද්ගලයින් 369 දෙනෙකු ස.එ.අ.බ. ක්‍රමය සඳහා ලියාපදිංචි වී ඇත.

**වගුව 29 - සරල කරන ලද එ.අ.බ. බැර වවුචර් විශ්ලේෂණය**

| | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|
| ආපසු ගෙවන ලද එ.අ.බ. ප්‍රමාණය (රු.) | 3,149,577,623 | 459,692,181 | 1,112,689,379 | 931,478,754 |
| වසර තුළ ශුද්ධ ආදායම් රැස්කිරීම % | 1.54% | 0.21% | 0.47% | 0.43% |
| නිකුත් කරන ලද සරල කරන ලද එ.අ.බ. බැර වවුචර්වල එ.අ.බ. කොටසෙහි වටිනාකම (දේශීය මිලදී ගැනීමට අදාළව) | 41,991,314,893 | 45,337,507,743 | 47,304,211,325 | 37,458,840,366 |

# පරිච්ඡේදය 6

# ජාත්‍යන්තර සබඳතා

## 6.1 ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම්

ජාත්‍යන්තර වෙළෙඳාමේ දී හෝ ගනුදෙනුවල දී සිදුවන නෛතික ද්විත්ව බදුකරණය සහ ආදායම් පැහැර හැරීම ඉවත් කිරීම හෝ අඩු කිරීම පිණිස ලෝකයේ ස්වාධීන රාජ්‍යයන් විසින් ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම්වලට එළැඹේ. විදේශ ආයෝජන ඇදගැනීමෙහි ලා ණය යාන්ත්‍රණය, විශේෂඥ දැනුම, නවීන තාක්ෂණය සහ රැකියා අවස්ථා යනාදිය ලබාගැනීම පිණිස මග පෙන්වීම වැනි විවිධාකාරයෙන් මෙම ගිවිසුම් විශේෂ කාර්ය භාරයන් ඉටු කරන බැවින්, ඒවා සංවර්ධනය වෙමින් පවත්නා වූ රටවලට බෙහෙවින් සුවිශේෂී වේ.

මෙයට අතිරේක වශයෙන්, ශ්‍රී ලංකාවේ ඇතැම් ගිවිසුම් පාර්ශ්වකරුවන් සමඟ දැනටමත් ඇති කරගෙන ඇති පරිදි, ගිවිසුමකට එළඹෙන රටවල් දෙක අතර සමගිය සහ සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා ද ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්වලට එළඹෙනු ලැබේ.

පහත සඳහන් 30 වැනි වගුවේ දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාව 2015.12.31 දින වන විට රටවල් 42 ක් සමඟ ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්වලට සහ බහු පාර්ශ්වීය ගිවිසුම්වලට එළැඹ තිබේ.

**වගුව 30 - 2014.12.31 දිනට ද්විත්ව බදු ගිවිසුම් බලපවත්නා රටවල්**

| | රට | ගිවිසුම් අත්සන් කළ දිනය | ගැසට් පත්‍රය | | ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වීම (තක්සේරු වර්ෂය අනුව) |
|---|---|---|---|---|---|
| | | | අංකය | දිනය | |
| 1 | ඕස්ට්‍රේලියාව | 18-12-1989 | 657/2 | 08-04-1991 | 1992/93 |
| 2 | බංගලිදේශය | 24-07-8196 | 448/13 | 07-04-1987 | 1989/90 |
| 3 | බෙල්ජියම | 03-02-1983 | 292/6 | 09-04-1984 | 1984/85 |
| 4 | කැනඩාව | 23-06-1982 | 253/8 | 13-07-1983 | 1986/87 |
| 5 | චීනය | 11-08-2003 | 1374/20 | 6-01-2005 | 2006/07 |
| 6 | ඩෙන්මාර්කය (සංශෝධිත) | 22-12-1981 | 228/15 | 20-01-1983 | 1980/81 |
| 7 | ප්‍රංශය | 17-09-1981 | 210/17 | 17-09-1982 | 1982/83 |
| 8 | ෆින්ලන්තය | 18-05-1982 | 253/8 | 13-07-1983 | 1981/82 |
| 9 | ජර්මනිය | 13-09-1979 | 113 | 31-10-1980 | 1982/83 |
| 10 | හොංකොං (සීමිත) | 26-03-2004 | 1374/21 | 06-01-2005 | 2005/06 |
| 11 | ඉන්දියාව (සංශෝධිත) | 22-01-2013 | 1828/9 | 17-09-2013 | 2014/15 |
| 12 | ඉන්දුනීසියාව | 03-02-1993 | 789/10 | 21-10-1993 | 1995/96 |
| 13 | ඉරානය | 25-07-2000 | 1187/16 | 06-06-2001 | 2002/03 |
| 14 | ඉතාලිය | 28-03-1984 | 322/4 | 05-11-1984 | 1978/79 |
| 15 | ජපානය | 12-12-1967 | 14803/5 | 29-05-1968 | 1969/70 |
| 16 | කොරියාව | 28-05-1984 | 342/11 | 29-03-1985 | 1980/81 |
| 17 | කුවේටය | 05-02-2002 | 1245/19 | 18-07-2002 | 2002/03 |
| 18 | මලයාසියාව (සංශෝධිත) | 16-09-1997 | 1028/21 | 22-05-1998 | 99/2000 |
| 19 | මොරිෂස් | 12-03-1996 | 958/10 | 15-01-1997 | 1998/99 |
| 20 | නේපාලය | 06-07-1999 | 1116/6 | 26-01-2000 | 2001/02 |
| 21 | නෙදර්ලන්තය | 17-11-1982 | 281/13 | 26-01-1984 | 1979/80 |
| 22 | නෝර්වේ (සංශෝධිත) | 01-12-1986 | 464/4 | 27-07-1987 | 1989/90 |
| 23 | ඕමානය (සීමිත) | 26-07-1994 | 881/7 | 26-07-1995 | 1979/80 |
| 24 | පකිස්ථානය (සංශෝධිත) | 15-10-1981 | 210/17 | 17-09-1982 | 1983/84 |
| 25 | පිලිපීනය | 11-10-2000 | 1237/7 | 21-05-2002 | 2010/11 |
| | | | 1256/27 | 02-10-2002 | |
| 26 | පෝලන්තය | 25-04-1980 | 130 | 27-02-1981 | 1984/85 |
| 27 | කටාර් | 07-11-2004 | 1422/10 | 05-12-2005 | 2008/09 |
| 28 | රුමේනියාව | 19-10-1984 | 371/9 | 15-10-1985 | 1986/87 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 29 | රුසියාව | 02-03-1999 | 1101/22 | 15-10-1999 | 2003/04 |
| 30 | සවුදි අරාබිය (සීමිත) | 16-12-1999 | 1101/23 | 15-10-1999 | 1983/84 |
| 31 | සිංගප්පූරුව | 29-05-1979 | 57/11 | 10-10-1979 | 1977/78 |
| 32 | ස්වීඩනය | 23-02-1983 | 297/28 | 18-05-1984 | 1985/86 |
| 33 | ස්විස්ටර්ලන්තය | 11-01-1983 | 292/6 | 09-04-1984 | 1981/82 |
| 34 | තායිලන්තය | 14-12-1988 | 571/16 | 18-08-1989 | 1990/91 |
| 35 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය (සීමිත) | 07-07-1992 | 824/13 | 23-06-1994 | 1979/80 |
| 36 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය (පූර්ණ) | 24-09-2003 | 1346/1 | 21-06-2004 | 2004/05 |
| 37 | එක්සත් රාජධානිය | 21-06-1979 | 60/23 | 02-11-1979 | 1977/78 |
| 38 | අමෙරිකා එක්සත් ජනපදය (සංධානය) | 20-09-2002 | 1298/8 | 21-07-2003 | 2004/05 |
| 39 | අමෙරිකා එක්සත් ජනපදය | 14-03-1985 | 398/4 | 22-04-1986 | |
| 40 | වියට්නාමය | 26-10-2005 | 1455/9 | 24-07-2006 | 2007/08 |
| 41 | සීෂෙල්ස් | 23-09-2011 | 1837/14 | 20-11-2013 | 2015/16 |
| 42 | බෙලාරුස් | 26-08-2013 | 1837/13 | 20-11-2013 | 2015/16 |
| 43 | පලස්තීනය | 16-04-2012 | 1838/8 | 26-11-2013 | 2015/16 |
| 44 | ලක්සම්බර්ග් | 31-01-2013 | 1838/9 | 26-11-2013 | 2015/16 |
| **බහුපාර්ශ්වීය ගිවිසුම්** | | | | | |
| 1 | සාර්ක් බහුපාර්ශ්වීය ගිවිසුම | 13-10-2005 | 1447/3 | 29-05-2006 | 2011/2012 |

### 6.1.1 2015 වර්ෂය තුළ ද්විත්ව බදු ගිවිසුම්වලට අදාළ කටයුතු

**පෝලන්තය සමඟ සංශෝධිත ගිවිසුම**

මෙම ගිවිසුමට අදාළ සම්මුති සාකච්ඡා 2013 දෙසැම්බර් මස 02 - 06 කාලසීමාව තුළ දී පෝලන්තයේ වොර්ෂෝ (Warsaw) හි දී පවත්වන ලද අතර ගිවිසුමෙහි කෙටුම්පත නිල මට්ටමින් ආරම්භකොට අවසන් කරන ලදි.

එයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2014 ජුනි මස 05 වැනි දින දී ලබාගන්නා ලදුව 2015 ඔක්තෝබර් මස 06 වන දින රාජ්‍ය මට්ටමින් අත්සන් තබන ලදි. පාර්ලිමේන්තුව සඳහා ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතුව ඇත.

## 6.2 අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වයන්

**වගුව 31 - අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වය**

| | නිලධාරියාගේ නම සහ තනතුර | වැඩ සටහන | රට | කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| 1 | කේ.දහනායක මහත්මිය<br>කොමසාරිස් ජනරාල් | ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදුකාරණාවන්හි දී අන්‍යොන්‍ය පරිපාලනමය සහාය පිළිබඳ සාර්ක් නිසි බලධරයන්ගේ 4 වන සමුළුව | ඉන්දියාව | 23.04.2015-24.04.2015 |
| 2 | ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදුකාරණාවන්හි දී අන්‍යොන්‍ය පරිපාලනමය සහාය පිළිබඳ සාර්ක් නිසි බලධරයන්ගේ 4 වන සමුළුව | ඉන්දියාව | 23.04.2015-24.04.2015 |
| 3 | කේ.එස්.බී.ආර්.ඩී.එස්. කරුණාරත්න මිය<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | BEPS ව්‍යාපෘතිය හා සම්බන්ධ ආසියා - පැසිෆික් තලාපීය ජාල රැස්වීම | කොරියාව | 11.02.2015-15.02.2015 |
| 4 | බී.ඒ.ඩී.ඩී. හේරත් මිය<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | BEPS ව්‍යාපෘතිය හා සම්බන්ධ ආසියා - පැසිෆික් තලාපීය ජාල රැස්වීම | කොරියාව | 11.02.2015-15.02.2015 |
| 5 | ටී.එම්. දයාරත්න මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | බදුකරණය හා සම්බන්ධ මිල පැවරුම් සහ OECD හි කාර්ය සාධන බලකාය සම්බන්ධ ලෝක සංසදයේ වාර්ෂික රැස්වීම සහ පදනම ක්ෂයවීම (erosion) සහ ලාභ විතැන්වීම (BEPS) සහ සංවර්ධනය වන රටවල් හා සම්බන්ධ සංවර්ධන රැස්වීම | ප්‍රංශය | 15.03.2015-21.03.2015 |

| | | | | |
|---|---|---|---|---|
| 6 | පී.එම්. දිසානායක මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදුකාරණාවන්හි දී අන්‍යොන්‍ය පරිපාලනමය සහාය පිළිබඳ සාර්ක් නිසි බලධරයන්ගේ 4 වන සමුළුව | ඉන්දියාව | 23.04.2015-<br>24.04.2015 |
| 7 | පී.එල්.එස්. ලියනගේ මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | බදුකරණය හා සම්බන්ධ මිල පැවරුම් සහ OECD හි කාර්ය සාධන බලකාය සම්බන්ධ ලෝක සංසදයේ වාර්ෂික රැස්වීම සහ පදනම ක්ෂයවීම (erosion) සහ ලාභ විතැන්වීම (BEPS) සහ සංවර්ධනය වන රටවල් හා සම්බන්ධ සංවර්ධන රැස්වීම | ප්‍රංශය | 15.03.2015-<br>21.03.2015 |
| 8 | ජේ. රත්නායක මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | බදුකරණය හා සම්බන්ධ මිල පැවරුම් සහ OECD හි කාර්ය සාධන බලකාය සම්බන්ධ ලෝක සංසදයේ වාර්ෂික රැස්වීම සහ පදනම ක්ෂයවීම (erosion) සහ ලාභ විතැන්වීම (BEPS) සහ සංවර්ධනය වන රටවල් හා සම්බන්ධ සංවර්ධන රැස්වීම | ප්‍රංශය | 15.03.2015-<br>21.03.2015 |
| 9 | ජේ. ඒ.ඒ. පරාක්‍රම මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදුකාරණාවන්හි දී අන්‍යොන්‍ය පරිපාලනමය සහාය පිළිබඳ සාර්ක් නිසි බලධරයන්ගේ 4 වන සමුළුව | ඉන්දියාව | 23.04.2015-<br>24.04.2015 |
| 10 | ඊ.එස්. ද කොස්තා මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | බදුකරණය හා සම්බන්ධ මිල පැවරුම් සහ OECD හි කාර්ය සාධන බලකාය සම්බන්ධ ලෝක සංසදයේ වාර්ෂික රැස්වීම සහ පදනම ක්ෂයවීම (erosion) සහ ලාභ විතැන්වීම (BEPS) සහ සංවර්ධනය වන රටවල් හා සම්බන්ධ සංවර්ධන රැස්වීම | ප්‍රංශය | 15.03.2015-<br>21.03.2015 |
| 11 | එච්.එම්.ඩබ්.සී. බණ්ඩාර මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | බදුකරණය හා සම්බන්ධ මිල පැවරුම් සහ OECD හි කාර්ය සාධන බලකාය සම්බන්ධ ලෝක සංසදයේ වාර්ෂික රැස්වීම සහ පදනම ක්ෂයවීම (erosion) සහ ලාභ විතැන්වීම (BEPS) සහ සංවර්ධනය වන රටවල් හා සම්බන්ධ සංවර්ධන රැස්වීම | ප්‍රංශය | 15.03.2015-<br>21.03.2015 |
| 12 | ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා<br>කොමසාරිස් | LHDNM - OECD ගැටළු නිරාකරණය සහ වැළැක්වීම | මැලේසියාව | 11.02.2015-<br>15.02.2015 |
| 13 | ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා<br>කොමසාරිස් | මිල පැවරුම් සම්බන්ධ ලෝක සංසදයේ තුන්වන වාර්ෂික සාකච්ඡාව | ප්‍රංශය | 26.07.2015-<br>01.08.2015 |
| 14 | එම් එච්. ඩෙන්සිල් මහතා<br>කොමසාරිස් | බදුකරණය හා සම්බන්ධ මිල පැවරුම් සහ OECD හි කාර්ය සාධන බලකාය සම්බන්ධ ලෝක සංසදයේ වාර්ෂික රැස්වීම සහ පදනම ක්ෂයවීම (erosion) සහ ලාභ විතැන්වීම (BEPS) සහ සංවර්ධනය වන රටවල් හා සම්බන්ධ සංවර්ධන රැස්වීම | ප්‍රංශය | 15.03.2015-<br>21.03.2015 |
| 15 | යූ.බී. වක්කුඹුර මහතා<br>කොමසාරිස් | බදුකරණය හා සම්බන්ධ මිල පැවරුම් සහ OECD හි කාර්ය සාධන බලකාය සම්බන්ධ ලෝක සංසදයේ වාර්ෂික රැස්වීම සහ පදනම ක්ෂයවීම (erosion) සහ ලාභ විතැන්වීම (BEPS) සහ සංවර්ධනය වන රටවල් හා සම්බන්ධ සංවර්ධන රැස්වීම | ප්‍රංශය | 15.03.2015-<br>21.03.2015 |
| 16 | ඩී.එම්.පී. ගනේපොල මහත්මිය<br>කොමසාරිස් | OECD බදු ගිවිසුම් 20 වැනි වාර්ෂික රැස්වීම | ප්‍රංශය | 02.11.2015-<br>04.11.2015 |
| 17 | එම්.අයි.එම්. තාහීර් මහතා<br>කොමසාරිස් | OECD බදු ගිවිසුම් 20 වැනි වාර්ෂික රැස්වීම | ප්‍රංශය | 02.11.2015-<br>04.11.2015 |
| 18 | ටී.එම්.ජේ.එම්. බණ්ඩාර මහතා<br>කොමසාරිස් | ප්‍රතිවිරෝධී අන්තර්ජාතික බදු වැළැක්වීම සහ BEPS | මැලේසියාව | 19.04.2015-<br>25.04.2015 |
| 19 | කේ.ජී.එස්. රාජිණී මහත්මිය<br>කොමසාරිස් | ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදුකාරණාවන්හි දී අන්‍යොන්‍ය පරිපාලනමය සහාය පිළිබඳ සාර්ක් නිසි බලධරයන්ගේ 4 වන සමුළුව | ඉන්දියාව | 23.04.2015-<br>24.04.2015 |
| 20 | බී. අතුකෝරාල මහත්මිය<br>කොමසාරිස් | LHDNM - OECD ඉදිරි පියවර ගැනීම සහ BEPS බදු ගිවිසුම් ආශ්‍රිත ගැටළු හා සම්බන්ධ බදු ගිවිසුම් සම්මන්ත්‍රණය | මැලේසියාව | 15.03.2015-<br>21.03.2015 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | ඩී.ආර්.කේ. පන්නිල විතාන මහත්මිය<br>කොමසාරිස් | LHDNM - OECD ඉදිරි පියවර ගැනීම සහ BEPS බදු ගිවිසුම් ආශ්‍රිත ගැටළු හා සම්බන්ධ බදු ගිවිසුම් සම්මන්ත්‍රණය | මැලේසියාව | 15.03.2015-21.03.2015 |
| 22 | ඩබ්.පී.සී.එස්. රණවීර මහතා<br>කොමසාරිස් | ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදුකාරණාවන්හි දී අන්‍යෝන්‍ය පරිපාලනමය සහාය පිළිබඳ සාර්ක් නිසි බලධරයන්ගේ 4 වන සමුළුව | ඉන්දියාව | 23.04.2015-24.04.2015 |
| 23 | ආර්.පී.එච්. ප්‍රනාන්දු මහත්මිය<br>කොමසාරිස් | BEPS ව්‍යාපෘතිය හා සම්බන්ධ ආසියා - පැසිෆික් කලාපීය ජාල රැස්වීම | කොරියාව | 11.02.2015-15.02.2015 |
| 24 | ආර්.පී.එච්. ප්‍රනාන්දු මහත්මිය<br>කොමසාරිස් | LHDNB - OECD: මිල පැවරුම් ගැටළු නිරාකරණය සහ වැළැක්වීම | මැලේසියාව | 26.07.2015-01.08.2015 |
| 25 | ඩී.ජේ. ජයතිලක මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | ප්‍රතිවිරෝධී අන්තර්ජාතික බදු වැළැක්වීම සහ BEPS | මැලේසියාව | 19.04.2015-25.04.2015 |
| 26 | ඒ.එම්. නෆීල් මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් | අන්තර් ජාතික ගනුදෙනුවලට අදාළ බදුකරණය හා සම්බන්ධ වැඩමුළුව | මැලේසියාව | 10.05.2015-30.05.2015 |
| 27 | එම්.එච්.ඩී. මෙනේරිපිටිය මහතා<br>සහකාර කොමසාරිස් | අන්තර් ජාතික ගනුදෙනුවලට අදාළ බදුකරණය හා සම්බන්ධ වැඩමුළුව | මැලේසියාව | 10.05.2015-30.05.2015 |
| 28 | පී.ඒ.ඩී.ඒ.සී. පොන්වීර මෙනෙවිය<br>සහකාර කොමසාරිස් | අන්තර් ජාතික ගනුදෙනුවලට අදාළ බදුකරණය හා සම්බන්ධ වැඩමුළුව | මැලේසියාව | 10.05.2015-30.05.2015 |
| 29 | එම්.සී. ගුණතිලක මෙනෙවිය<br>සහකාර කොමසාරිස් | අන්තර් ජාතික ගනුදෙනුවලට අදාළ බදුකරණය හා සම්බන්ධ වැඩමුළුව | මැලේසියාව | 10.05.2015-30.05.2015 |

# පරිච්ඡේදය 7

# ව්‍යවස්ථා සම්පාදනය

## 7.1 වසර තුළදී පනවන ලද ව්‍යවස්ථාවන්

i. 2015 අංක 09 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

ii. 2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

iii. 2015 අංක 11 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

iv. 2015 අංක 12 ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

v. 2015 අංක 14 දරන ඔට්ටු සහ සූදු බදු (සංශෝධන) පනත

## 7.2 අනුමත පුණ්‍යායතන

වර්ෂය තුළදී එක් අනුමැතියක් ලබාදී ඇත.

| | |
|---|---|
| පුණ්‍යායතනය | (Ash Shifa) අෂ් ෂිෆා |
| ලිපිනය | 242, කොළොන්නාව පාර, වැල්ලම්පිටිය. |
| ගැසට් අංකය | 1907/18 |
| ලියාපදිංචි දිනය | 2015.03.25 |

## 7.3 ගැසට් නිවේදන

දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලැබූ අදාළ පනත් යටතේ පහත සඳහන් ගැසට් නිවේදන වර්ෂය තුළදී නිකුත් කරන ලදි.

.

**වගුව 32 - 2015 වර්ෂය තුළදී ප්‍රසිද්ධියට පත්කරන ලද ගැසට් නිවේදන**

| | ගැසට් අංකය | දිනය | විස්තර |
|---|---|---|---|
| I | 1907/26 | 25.03.2015 | ආශ්‍රිත ව්‍යවසායන් සමඟ ගනුදෙනු කිරීමට අදාළව 107 (2) (ආ) වන වගන්තිය යටතේ අනුමත ගණකාධිකාරීවරුන්ගේ සහතිකය. |
| II | 1910/02 | 16.04.2015 | සරළ කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රම ක්‍රියාත්මක කිරීම |
| III | 1933/14 | 21.09.2015 | 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ) විධිවිධාන යටතේ 2006.10.05 දිනැති අංක 1465/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද නියෝගයේ උපලේඛනයේ අංක 07 අයිතමය සංශෝධනය කිරීම. |

## 7.4 අර්ථ නිරූපණ කමිටුව

දේශීය ආදායම් පනතේ 208 අ වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2011 වසරේ පත්කරන ලද බදු නීති පිළිබඳ අර්ථ කථනය සඳහා වන කමිටුව (CITL) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත වන අතර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයෙකුගේ සභාපතිත්වයෙන් යුක්ත වේ. මෙම කමිටුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පරිපාලනය කරනු ලබන පනත්වල විධිවිධාන අර්ථ නිරූපණයන්, පැහැදිලි කිරීම, මාර්ගෝපදේශ යනාදිය නිකුත් කිරීම සඳහා බැඳී ඇත.

කවර හෝ තැනැත්තෙකුට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලිත පනතක විධිවිධානයන්හි ව්‍යාකූලතාවයක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් කමිටුවෙහි අර්ථ නිරූපණය ඉල්ලා සිටිය හැකි ය. (කමිටු ලේකම්, ලේකම් අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව) අර්ථ නිරූපණයන් සහ ක්‍රියාපටිපාටීන්ට අදාළව සමානාත්මතාවය සහතික වනු පිණිස අවශ්‍ය මාර්ගෝපදේශ සහ උපදෙස් නිකුත් කිරීම සඳහා මෙම කමිටුව වෙත බලය පවරා ඇත. අදාළ වර්ෂය තුළ දී අර්ථ නිරූපණ 38 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදි. මෙම කමිටුව මගින් ලබාදෙන ලද අර්ථ නිරූපණයන් පිළිබඳ විස්තර 33 වගුවෙන් දක්වා ඇත.

**වගුව 33 – 2015 වර්ෂය තුළ දී කමිටුව විසින් ලබාදෙන ලද අර්ථ නිරූපණයන් පිළිබඳ විස්තර**

| ක්ෂේත්‍රය | ආදායම් බදු | එකතු කළ අගය මත බද්ද | ජාතිය ගොඩනැගීමේ බද්ද | මුද්දර බදු | ආර්ථික සේවා ගාස්තු | ඉඩම් බද්ද | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් බදු බැඳියාව | 1 | 4 | 1 | | 1 | 1 | 8 |
| ලාභාංශ | 2 | | | | | | 2 |
| නිදහස් කිරීම් | 2 | 2 | 1 | | | | 5 |
| ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී අවසරලත් අඩුකිරීම් | 3 | | | | | | 3 |
| සේවා නියුක්ත ආදායම | 5 | | | | | | 5 |
| සුදුසුකම් ලැබීමේ ගෙවීම් | 3 | | | | | | 3 |
| අර්ථ නිරූපණය | 4 | | 2 | 1 | | | 7 |
| යටත් පිරිවැටුම ආගණනය කිරීම | | | | | 1 | | 1 |
| ක්‍රියා මාර්ග | | 1 | | | | | 1 |
| වෙනත් | 2 | | | | 1 | | 3 |
| **එකතුව** | **22** | **7** | **4** | **1** | **3** | **1** | **38** |

# පරිච්ඡේදය 8
# අනෙකුත් කාර්යයන්

## 8.1 බදු සේවා අංශය

බදු සේවා අංශය බදු ගෙවන්නන් සහ මහජනතාව වෙත පහසුවෙන් දෙපාර්තමේන්තු සේවා ලබාගත හැකිවන පරිදි පහසුකම් සලසා ඇත. උපකාර හෝ තොරතුරු ලබාගැනීම සඳහා පැමිණෙන්නා වූ සෑම තැනැත්තෙකුටම සහයෝගය ලබාදීම පිණිස මෙම ඒකකයට නිලධාරීන් යොදවා ඇත. අදාළ අණ පනත්, දෙපාර්තමේන්තු ප්‍රකාශන, ගෙවීම් පත්‍රිකා, ආකෘති පත්‍ර යනාදිය මෙම ඒකකයෙන් ලබාගත හැකි ය. සිදුවිය හැකි ප්‍රමාදයන් හා අපහසුතාවයන් මග හරවාලීම පිණිස බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක (TIN) සහ තාවකාලික එකතු කළ අගය මත බදු අංක මෙම අංශය මගින් නිකුත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදි. ඒ අනුව, මෙම ඒකකය මගින් බදු ගෙවන්නන් හඳුනාගැනීමේ (TIN) අංක 6959 ක් සහ තාවකාලික එ.අ.බ. අංකයන් 29,034 ක් වර්ෂය තුළ දී නිකුත් කර ඇත.

නව ලිපිගොනු විෘත කිරීම සඳහා මෙම අංශය විසින් තොරතුරු අංශය වෙත තාවකාලික එ.අ.බ. අයදුම්පත් 3,523 ක් සහ මෙම ලිපිගොනු පවත්වාගෙන යාම සඳහා සංස්ථාපිත අංශය වෙත TIN අයදුම්පත් 4034 ඉදිරිපත් කරන ලදි.

තවද, බදු ගෙවන්නන් නොවන පුද්ගලයින් සඳහා නිෂ්කාශන සහතික පත් 396 ක් නිකුත් කරනු ලැබූ අතර, බදු ගෙවන්නන්ගේ යහපත උදෙසා අත් පත්‍රිකා කිහිපයක්ම පිළියෙල කිරීමට යෙදුණි. එසේම, වසර තුළ දී දැනුවත් කිරීමේ වැඩසටහන් 11 ක් සංවිධානය කිරීමට අතිරේක වශයෙන් බදු ගෙවන්නන් සඳහා බදු උපදේශන සේවා බදු සේවා අංශය මගින් සලසා ඇත.

## 8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විධානයන් සහ නිෂ්කාශන සහතික පත් පිළිබඳ විස්තර

වගුව 34 - දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විධානයන් හා නිෂ්කාශන සහතික

| විස්තරය | 2015 | 2014 |
|---|---|---|
| **නිකුත් කරන ලද විධානයන්** | | |
| • පොළිය මත රඳවාගැනීම් බදු සඳහා බැංකු වෙත | 144 | 272 |
| **නිකුත් කරන ලද නිෂ්කාශන සහතිකපත්** | | |
| • රට හැර යන තැනැත්තන් සම්බන්ධයෙන් | 396 | 321 |
| **නිකුත් කරන ලද වරප්‍රසාද කාඩ්පත්** | | |
| • රන් කාඩ් පත් | 411 | 102 |
| • රිදී කාඩ් පත් | 234 | 68 |
| **මෝටර් රථ ආනයනය මත බදු සහන සඳහා නිකුත් කරන ලද සහතිකපත්** | | |
| • සහතිකපත් සංඛ්‍යාව | 299 | 166 |

## 8.3 මිල පැවරුම් නියෝග අංශය

මිල පැවරුම් නියෝග ක්‍රියාවට නැංවීම සහ පරිපාලනය කිරීම සඳහා මෙන්ම ආශ්‍රිත ව්‍යවසායයන් අතර ගනුදෙනු අසම්බන්ධිත මිල හා අනුකූල වේද යන්න සහතික කිරීම සඳහා මිල පැවරුම් නියෝග අංශය 2013 වසරේ දී ස්ථාපනය කරන ලදි.

වසර තුළ දී විශ්ව මිල පැවරුම් ක්‍රමය පිළිබඳව දැනුම වැඩිදියුණු කරගැනීම සහ විශ්ව මිල පැවරුම් ගැටළු අවබෝධ කරගැනීම පිණිස දෙපාර්තමේන්තුවේ විවිධ අංශයන්ගෙන් තෝරාගනු ලැබූ නිලධාරීන් කණ්ඩායමක් සඳහා මිල පැවරුම් නියෝග අංශය විසින් ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වන සංවිධානයේ සහාය ඇතිව නේවාසික වැඩමුළු 3 ක් සංවිධානය කරන ලදි.

දෙපාර්තමේන්තුවේ විවිධ වූ තක්සේරු අංශයන් වෙතින් ලද සිද්ධීන් 25 ක් සඳහා අසම්බන්ධිත මිල නිශ්චය කිරීම මිල පැවරුම් නියෝග අංශයේ නිලධාරීන් විසින් අවසන් කර ඇත.

## 8.4 පුහුණු අංශය

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පවත්වන ලද, පුහුණු වැඩසටහන්වලට අතිරේක වශයෙන් වසර තුළ දී බදු ගෙවන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් මෙම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය මගින් සංවිධානය කරන ලදි.

**වගුව 35 - දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර**

| විෂය | ආයතනය | සහභාගි වූ පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් සහ ගණකාධිකාරීවරුන් සඳහා බදුකරණය සම්බන්ධ වැඩමුළුව | සබරගමුව පළාත් සභාව | 60 |
| දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්, දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන් සහ ගණකාධිකාරීවරුන්. | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 65 |
| ශිෂ්‍යයින් සඳහා බදුකරණය සම්බන්ධ සම්මන්ත්‍රණය | වයඹ විශ්ව විද්‍යාලය | 140 |

# පරිච්ඡේදය 9

# ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS)

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහනට (FMRP) අනුගතව, ආදායම් පරිපාලනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අභිලාෂය පෙරදැරිව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතියක් (RAMIS) හඳුන්වාදීමේ අවශ්‍යතාවක් පැවතිණි. ඒ අනුව, අමාත්‍යාංශය විසින් 2013 වසරේ දී ඒ සඳහා අවශ්‍ය මූලික පියවර ගන්නා ලදි.

ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ අරමුණ වන්නේ බදු පදනම සහ බදු පරිපාලනයේ කාර්යක්ෂමතාවය පුළුල් කරමින් බදු අනුකූලතාවය ඉහළ නැංවීමෙහි ලා පහසුකම් සැලසීමත් එමගින් වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයෙන් බදු ගෙවන්නන් වෙත ළඟාවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට (IRD) අවශ්‍ය ශක්තිය ලබාදෙමින් ආදායම් රැස්කිරීම වැඩි කිරීමයි.

මීට අදාළව සහාය වීම පිණිස රජයකින් රජයකට (G to G) යන පදනම මත සම්මුති සාකච්ඡා පැවැත්වීම සඳහා සිංගප්පූරු රජය සමඟ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් 2012 නොවැම්බර් මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදි. ඒ අනුව, මෙම කාර්යය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ සිංගප්පූරුවේ අන්තර්ජාතික තොරතුරු තාක්ෂණ සංවර්ධන අධිකාරිය (IDAI සිංගප්පූර්) අතර අවබෝධතා ගිවිසුමක් (MOU) 2013 ජූනි මස 5 වන දින අත්සන් තබන ලදි.

සම්මුති සාකච්ඡා පැවැත්වීමේ කාර්යය සඳහා කමිටුවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදි. එනම්, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව (CANC) සහ තාක්ෂණික ඇගයුම් කමිටුව (TEC) යි. සිංගප්පූරුවේ අන්තර්ජාතික තොරතුරු තාක්ෂණ සංවර්ධන අධිකාරිය (IDAI) විසින් කෙටුම්පත් යෝජනාවක් ඉදිරිපත් කරන ලදුව, එය තාක්ෂණ ඇගයුම් කමිටුව (TEC) විසින් තක්සේරු කරන ලදි.

2013 වසරේ නොවැම්බර් මස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි (IRD) සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා වැඩසටහනෙහි (FMRP) ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් සිංගප්පූරුවේ සංචාරයක නිරත වූ අතර සිංගප්පූරුවේ අන්තර්ජාතික තොරතුරු තාක්ෂණික සංවර්ධන අධිකාරිය NCSI-S, සහ සිංගප්පූරුවේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ඉහළ මට්ටමේ සාකච්ඡා පවත්වන ලදි. එසේම මෙම කණ්ඩායම සිංගප්පූරුවේ දේශීය ආදායම් අධිකාරියේ බදු සේවා අංශයෙහි ද සංචාරය කළේය. මෙම නිලධාරී කණ්ඩායම විසින් වඩාත් උද්යෝගයෙන් (අනලස්ව) වාර්තාව පිළියෙල කොට අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව, කෙටුම්පත් යෝජනාව මත පදනම්ව IDAI සමඟ සාකච්ඡා කොළඹ දී පවත්වන ලද අතර කොන්ත්‍රාත් මිල සහ පොදු කොන්දේසි පිළිබඳව නිගමනයකට එළඹෙන ලදි. ඒ අනුව, ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාවට නැංවීමේ කොන්ත්‍රාත් ගිවිසුම IDAI සහ IRD අතර 2014 මැයි මස අත්සන් තබන ලදි.

ගිවිසුමට අනුව, ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතියක් (RAMIS) අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමට නියමිත ය. එනම්, 1 වන අදියර සංස්ථාපිත ආදායම් බදු, එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, රඳවුම් බදු සහ උපයන විට ගෙවීමේ බදු ආවරණය වන පරිදි සහ 2 වන අදියර තනි පුද්ගල ආදායම් බදු, හවුල් ව්‍යාපාර බදු, මුද්දර ගාස්තු, ආර්ථික සේවා ගාස්තු, ඔට්ටු සහ සූදු බදු, මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු යනාදිය සංස්ථාපිත නොවන බදු ආවරණය වන පරිදි වේ. මෙම ව්‍යාපෘතිය 2014 ජූනි මස සමාරම්භ කරන ලදි.

2014 වසර තුළ දී, සමාරම්භක වාර්තාව පිළියෙල කරන ලද අතර පළමු අදියර සඳහා අවශ්‍යතා රැස්කිරීම, වලංගුභාවය සහ ව්‍යාපාරික ක්‍රියාවලිය යළි හැසිරවීම (BPR) අවසන් කරන ලදි. ඒ අනුව, බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම, ආකෘති පත්‍ර හා වාර්තා, තක්සේරු කිරීම (NBT හා SVAT), නිෂ්කාශන සහතික, අභියාචනා සහ විරෝධතා පළකිරීම්, ගෙවීම්, ආපසු ගෙවීම් යනාදී කාර්යයන්ට අදාළ අවශ්‍යතා අවසන් කරන ලදි.

2015 වසරේ දී, තක්සේරු (සංස්ථාපිත ආදායම් බදු), එකතු කළ අගය මත බදු, රඳවා ගැනීමේ බදු සහ බදු ගෙවන්නන්ගේ මූල්‍යමය සඳහා අවශ්‍යතා අවසන් කරන ලදි. දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය භාෂාත්‍රයෙන්ම 2015 මැයි මස 30 වන දින ප්‍රසිද්ධ කරන ලද අතර එය 2015 ජූනි මස 3 වන දින නිල වශයෙන් දියත් කරන ලදි. NCSI-S මගින් සංවර්ධන සහ පද්ධති

ඒකාබද්ධ කිරීමේ පරීක්ෂණ (SIT) අවසන් කරන ලදුව, භාවිත කරන්නන් පිළිගන්නා පරීක්ෂණය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් 2015 අගෝස්තු මස ආරම්භ කරන ලදි. 2 වන අදියර සඳහා අවශ්‍යතා රැස්කිරීම BPR 2015 ඔක්තෝබර් මස ආරම්භ කරන ලදි.